සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව
வரையறுக்கப்பட்ட இலங்கை அரச (பொது) வர்த்தக கூட்டுத்தாபனம்
Sri Lanka State Trading (General) Corporation Ltd

1971-2021

50

Years

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT
2020-2021



සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

වාර්ෂික වාර්තාව

2020-2021

පටුන

දැක්ම, මෙහෙවර සහ ආයතනික අරමුණු.....04

අරමුණු, කර්තව්‍යයන්, සේවාවන් සහ වසර තුළ ප්‍රගතිය.....05

සංස්ථාපිත තොරතුරු.....06

අධ්‍යක්ෂක මණ්ඩලය.....07

සභාපතිතුමාගේ පණිවිඩය.....08

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන්.....09 - 10

නිෂ්පාදන කළඹ.....11 - 13

ව්‍යාපාර සමාලෝචනය.....14

රැකියා උත්පාදනය.....15

ආයතනික පාලනය.....16

විශේෂ මූල්‍ය සිදුවීම්.....17

විශේෂ මූල්‍ය සිදුවීම්වල ප්‍රස්ථාරික නිරූපණය.....18 - 19

සංස්ථාවේ අංශයන්හි කාර්යසාධනය.....20 - 21

විගණකාධිපති වාර්තාව.....22 - 24

විස්තීරණ ආදායම් ප්‍රකාශනය.....25

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව.....26

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය.....27

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.....28 - 29

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.....30 - 47

දැක්ම, මෙහෙවර සහ ආයතනික අරමුණු

අපගේ දැක්ම

දේශීය ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම

අපගේ මෙහෙවර

ශ්‍රී ලංකාවට ආසියාවේ වාණිජ කේන්ද්‍රස්ථානය වීමට සහාය වීමේ අරමුණින්
පාර්ශවකාර අභිලාෂ පවත්වා ගනිමින් අනෙකුත් සියලු අංශවල අවශ්‍යතා සපුරාලන අතර
මූලිකවම රාජ්‍ය අංශයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස
ඊට අවශ්‍ය සියලු නිෂ්පාදන හා සේවා සැපයීම.

ආයතනික අරමුණු

සාධාරණ ඉපැයුම් ඉපැයීම, පුද්ගල හා වෘත්තීය සංවර්ධනයට දායකවීම සහ
විශේෂිත සන්නාම හරහා නිෂ්පාදන නායකත්වය ස්ථාපිත කිරීම.

අරමුණු, කර්තව්‍ය, සේවාවන් සහ වසර තුළ ප්‍රගතිය

මෙහෙයුම් අරමුණු

- විවිධත්වයෙන් යුතු භාණ්ඩ හා සේවා විකුණුම තුළින් වෙළඳපොළ ස්ථාවර කිරීම.
- කීර්තිමත් සහ විශ්වසනීය ජාත්‍යන්තර සන්නාම අප රට තුළ නියෝජනය කිරීම.
- ආයතනයේ ආදායම සහ ලාභය වර්ධනය කිරීම මගින් එහි කීර්තිනාමය ස්ථාපිත කිරීම.
- රාජ්‍ය අංශයේ අවශ්‍යතා ඵලදායීව සැපයීම මගින් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම.
- ආයතනයේ ප්‍රධාන නිෂ්පාදන හරහා පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම පිණිස ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති, පාරිභෝගිකයන් සහ කාර්යමණ්ඩලය කෙරෙහි නිරන්තර අවධානය යොමුකිරීම මගින් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.

මෙහෙයුම් උපායමාර්ග

- පාරිභෝගික පදනම සහ ප්‍රවේශ්‍යතාව පුළුල් කිරීම.
- පාරිභෝගික අවශ්‍යතාවය අනුව නිෂ්පාදන කළඹ ඉහළ නැංවීම.
- මෙහෙයුම් සම්පත් කළමනාකරණය තුළින් වෙබ් සබල ව්‍යාපාරික කළමනාකරණය සහ දත්ත කළමනාකරණය සහ ප්‍රසම්පාදන අනුමතිය.
- ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩයන්හි සක්‍රීය සහ සඵල සහභාගිත්වය.

වසර තුළ ප්‍රගතිය

මෙම වසරේ ආයතනයේ ව්‍යාපාරික ආදායම රු. මිලියන 2,677ක් ලෙස වාර්තා විය. සමාලෝචිත වර්ෂය තුළ අනෙකුත් මෙහෙයුම් ආදායම රු. මිලියන 24කි. බදු පූර්ව ශුද්ධ ලාභය රු. මිලියන 46.9ක් ලෙස පෙන්නුම් කළ අතර මුළු ස්කන්ධ ප්‍රමාණය වසර තුළ රු. මිලියන 701 දක්වා වැඩි වුණි.

2021 මාර්තු අවසන් වන විට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 374 ක් විය.

නිෂ්පාදන ආයතන සමග හවුල්කාරිත්වයෙන් අපගේම STC සන්නාමය සහිත නිෂ්පාදන ස්ථාපිත කිරීමට අප සැලසුම් කර ඇති අතර නිෂ්පාදන මාලාවක් සැලසුම් කරමින් පවතී.

සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම : සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

නෛතික තත්ත්වය : 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ එස්.ටී.සී. ජෙනරල් ට්‍රේඩිං සමාගම වශයෙන් පැවැති නම 2010.10.01 දින ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව ලෙස වෙනස් කරන ලදී. පූර්වයෙන්, 1982 අංක 17 දරන රාජ්‍ය සමාගම් පනත යටතේ සීමාසහිත ලංකා ජෙනරල් ට්‍රේඩිං සමාගම ලෙස ස්ථාපිත කරනු ලැබූ එය ඊට පෙර 1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ පනත යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව ලෙසින් හඳුන්වනු ලැබීය. සමාගම වෙළඳ අමාත්‍යාංශයට අනුබද්ධව පවතී.

සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂක : යෝගා පෙරේරා මහතා - (2020.01.22 දින සම්බන්ධ විය)

අධ්‍යක්ෂක මණ්ඩලය :

බී. ඒ. ටී. රුද්‍රිගු මහතා	- (2020.01.20 දින සම්බන්ධ විය)
ඩී. ඒ. හෙට්ටිආරච්චි මහතා	- (2020.01.20 දින සම්බන්ධ විය)
යූ. දිසානායක මහතා	- (2020.01.20 දින සම්බන්ධ විය)
ඩී. ජේ. විද්‍යානච්චි මහතා	- (2020.01.21 දින සම්බන්ධ විය)
ජී. දහනායක මහත්මිය	- (2020.02.05 දින සම්බන්ධ විය)
ටී. ඒ. ඩී. රංජිත් මහතා	- (2020.02.14 දින සම්බන්ධ විය)

සමාගම් ලේකම් : ඒ. ඩබ්ලිව්. මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්) සමාගම

විගණක : විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය,
අංක. 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

බැංකුකරුවන් : මහජන බැංකුව
ජාතික සංවර්ධන බැංකුව
සම්පත් බැංකුව

ලියාපදිංචි කාර්යාලය : 100, නවම් මාවත,
කොළඹ - 02,
ශ්‍රී ලංකාව.
දුරකථනය : +94 112 422341-4, +94 112 440880
ෆැක්ස් : +94 112 447970
විද්‍යුත් තැපෑල : lankagen@sltnet.lk
වෙබ් අඩවිය : www.stc.lk

සමාගම් ලියාපදිංචි අංකය : PB 863

සේවක සංඛ්‍යාව : අවසන් වූ වර්ෂය තුළ සමාගම විසින් සේවකයන් 374 දෙනෙකු සේවයේ යොදවන ලදී.

අධ්‍යක්ෂක මණ්ඩලය



වමේ සිට දකුණට :
යූ. දිසානායක මහතා, ටී.ඒ.ඩී. රංජිත් මහතා, බී.ඒ.ටී. රුද්‍රිගු මහතා, ජී. දහනාහක මිය,
යෝගා පෙරේරා මහතා (සභාපති), ඩී.ජේ. විද්‍යානච්චි මහතා, ඩී.ඒ.හෙට්ටිආරච්චි මහතා

සභාපතිතුමාගේ පණිවිඩය

සභාපතිතුමාගේ පණිවිඩය

2020/2021 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට මම කැමැත්තෙමි.

බාහිර ව්‍යාපාරික පරිසර විහිදසුන

2020 වර්ෂයේ මාර්තු මස මැද භාගයේදී රට අගුලු දැමීම කරා යොමු වූ අතර කොවිඩ්-19 වසංගතය සඳහා පූර්වාරක්ෂක පියවරක් ලෙස එම තත්ත්වය කිහිප අවස්ථාවකදී නැවත නැවතත් පනවනු ලැබීය. එබැවින් රාජ්‍ය ආයතන, පුද්ගලික අංශයේ ව්‍යාපාර මෙන්ම සාමාන්‍ය මහජනතාවට ද මෙම වර්ෂය බෙහෙවින් අභියෝගාත්මක එකක් විය. 2020/2021 වසර තුළ බොහෝ දෙනෙකුට රැකියා අහිමිවූ අතර ව්‍යාපාරික අංශයේ ආදායම පහත වැටීම හේතුවෙන් පිරිවැය අවම කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස රටේ බොහෝ ව්‍යාපාරික අංශ වැටුප් කප්පාදු කිරීම් ද සිදු කරනු ලැබීය.

2019 වසර තුළ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය 1.7 %ක් වූ අතර 2020 වසරේදී එය -1.9%ක් ලෙස සෘණ වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම නිශේධනාත්මක ප්‍රවණතාව 2020 වසරේ දෙවන කාර්තුව දක්වා අඛණ්ඩව පැවැති අතර මූලිකවම රටේ පැවැති අගුලු දැමීමේ තත්ත්වය හේතු කොට ගෙන තවදුරටත් මෙය -16.6% දක්වා විශාල ලෙස පහත වැටුණි. 2020 වසරේ පළමු කාර්තුවේ අවසන් භාගයේදී ඇරඹී සමස්ත ආර්ථික ක්‍රියාකාරකම්වල මන්දගාමීත්වය 2020-2021 පළමු කාර්තු දෙක තුළ සෘජුවම රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ව්‍යාපාර කෙරෙහි බලපාන ලදී.

කෙසේ වුවද, එකී සියලු අභියෝග අවස්ථාවක් කර ගනිමින් මෙම දුෂ්කර තත්ත්වය උපායමාර්ගිකව කළමනාකරණය කර ගැනීමට අප සංස්ථාව සමත් වූ අතර 2020-2021 අවසානයේදී සංස්ථාව ලාභදායී ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමට අපට හැකි විය.

කාර්යසාධන සමාලෝචනය

පෙර වසරේ ශුද්ධ අලාභය හා සැසඳීමේදී, රටේ ආර්ථික තත්ත්වයේ පසුබෑම මධ්‍යයේ වුවද 2020/2021 මූල්‍ය වර්ෂයේදී අප සංස්ථාව රුපියල් මිලියන 51ක ශුද්ධ ලාභයක් වාර්තා කළ බව මා වාර්තා කරනුයේ හද පිරි සතුටිනි. 2020/2021 දී 20% ක දළ ලාභ ආන්තියකයක් සහිතව සංස්ථාවේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 2677ක් විය. පෙර වර්ෂය හා සැසඳීමේදී, මගේ සභාපතිත්වය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සංස්ථාවේ කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ තීරණවල ප්‍රතිඵලයක් ලෙස සමාගමේ පිරිවැටුම සහ දළ ලාභය පිළිවෙළින් 9% කින් හා 24% කින් වර්ධනය වී ඇත. මතු වෙමින් පවතින නව වෙළඳපොළ අවස්ථා හා අනුගත වෙමින් අපගේ නිෂ්පාදන කළඹ අභිවර්ධනය කළ අතර සාධාරණ මිලකට පාරිභෝගික භාණ්ඩ අලෙවි කිරීම පිණිස STC සන්නාමය යටතේ දේශීයව නිෂ්පාදනය කළ නිෂ්පාදන හඳුන්වා දීම මගින් සීෂ්‍රයෙන් අලෙවි වන පාරිභෝගික භාණ්ඩ වෙළෙඳ අංශයේ අලෙවිය ඉහළ නංවන ලදී.

තොග රැඳවුම් පිරිවැය හා ණයගැති රැඳවුම් පිරිවැය මෙන්ම අනෙකුත් පරිපාලන වියදම් අඩුකර ගැනීමට සංස්ථාව ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් පූර්ව වර්ෂය හා සැසඳීමේදී මෙහෙයුම් වියදම් 11% කින් ද මූල්‍ය වියදම් 45% කින් ද අඩුකර ගැනීමට ආයතනය සමත් විය. එමෙන්ම රටෙහි පැවති අගුලු දැමීමේ තත්ත්වය ද කාර්ය මණ්ඩල පිරිවැය සහ පරිපාලන වියදම් ද අඩු කර ගැනීමට හේතු විය. අභාවිත සහ සෙමින් අලෙවි වන ද්‍රව්‍ය අපහරණය කිරීමට පියවර ගත් අතර ණයගැතියන්ට අදාළව, ණය කාලසීමාව අඩු කිරීම පිණිස වූ නව ණය ප්‍රතිපත්තිය අප දැඩිව අනුගමනය කළ අතර එය මුදල් ප්‍රවාහය ශක්තිමත් කිරීමට හේතු විය. පූර්ව වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය පිරිවැය 45% ක් වැනි සැලකිය යුතු මට්ටමකට අඩුකිරීමට ප්‍රධානතම හේතුව වූයේ එයයි.

එමෙන්ම ඇතැම් වෙළඳ අංශ සහ සංස්ථා ප්‍රදර්ශනාගාරවල ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකරන ලදී. එසේම සියලු වෙළෙඳ අංශවල සහ ප්‍රදර්ශනාගාරවල ලාභදායීතාව ඉහළ නැංවීම පිණිස මාසික සමාලෝචන ක්‍රමවේදයක් ද කළමනාකාරිත්ව විසින් හඳුන්වා දෙන ලදී.

ප්‍රශස්ත හා තරඟකාරී මිල ගණන් ලබා ගැනීම හරහා ප්‍රතිලාභ උපරිම කර ගැනීම මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කරලීම පිණිස ක්‍රියාවට නංවන ලද නව ක්‍රමවේදය මෙම වසරේ සාර්ථකව ක්‍රියාත්මක විය.

2021 මාර්තු 31 දිනට සමාගමේ මුළු සේවක සංඛ්‍යාව 374ක් විය.

සමාජ වගකීම්

සිල්ලර වෙළඳපොළෙහි පාරිභෝජන භාණ්ඩ වල මිල ස්ථාවර කිරීමේ අරමුණින් රජය විසින් අනුගමනය කළ මිල පාලන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා, රජයේ ප්‍රධාන වෙළඳ ආයතනය ලෙස රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව සක්‍රීයව සහභාගි විය.

අනාගත සැලසුම්

- ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත ඉහළ නංවා ගැනීමට රජයට අපනයන හරහා විදේශීය වෙළඳපොළට ප්‍රවිශ්ඨ වීමට සංස්ථාව අදහස් කරයි.
- පවතින නිෂ්පාදන කළඹට නව නිෂ්පාදන හඳුන්වා දීම මගින් අලෙවි ආදායම් වර්ධනය කිරීම.
- වෙළඳපොළ මිල ගණන් ස්ථාවරව පවත්වා ගැනීම පිණිස අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය හා බෙදා හැරීම හා වෙළඳපොළ සැපයුම සුසංවිධිත කිරීම. එහි මූලික පියවරක් ලෙස, සහල් ආනයනය කර රජයේ සිල්ලර වෙළඳ ආයතනය හරහා බෙදා හරින ලදී.
- පුද්ගලික අංශය දක්වා වෙළඳපොළ ව්‍යාප්ත කිරීම.
- ව්‍යාපාරික මෙහෙයුම්වල කාර්යක්ෂමතාව හා සඵලතාව වැඩි දියුණු කිරීම පිණිස ව්‍යවසාය සම්පත් සැලසුම්කිරීමේ ක්‍රමවේදයක් (ERP) ක්‍රියාත්මක කිරීම.

ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් ලත් සහයෝගය තවදුරටත් අපේක්ෂා කරමින්, ගරු අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ මගේ සහෝදර සාමාජිකයන් ලබා දුන් දූරදර්ශී මග පෙන්වීම වෙනුවෙන් මාගේ කෘතඥ පූර්වක ඇගයීම පළ කිරීමට කැමැත්තෙමි. එසේම අපගේ බැංකුකරුවන් සහ මූල්‍ය වර්ෂය තුළ අපගේ සාර්ථකත්වය සඳහා දායකවූ සියලු පාර්ශවකරුවන්ට ස්තූතිය පිරිනැමීමට මම මෙය අවස්ථාවක් කර ගන්නා අතර ඔවුන්ගේ අඛණ්ඩ සහයෝගය තව දුරටත් අපේක්ෂා කරන්නෙමි.

යෝගා පෙරේරා
සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන්

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	නම
සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ	යෝගා පෙරේරා මහතා
සාමාන්‍යාධිකාරී	චම්ලා ඉද්දමල්ගොඩ මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලවි	එම්. එන්. මහේෂ් මෙන්ඩිස් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය	අයි. එම්. ඩී. කේ. ඉලංගසිංහ මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පාලන	ජේ. සී. කේ. මඩවල මහතා

අංශ ප්‍රධානීන්

රසායන ද්‍රව්‍ය හා ආශ්‍රිත නිෂ්පාදන අංශය	
සහකාර කළමනාකරු	කේ. එච්. ගුණවර්ධන මහතා
කාර්යාල උපකරණ සැපයුම් අංශය	
සහකාර කළමනාකරු	එම්. එල්. රන්ජන් පද්මලාල් මහතා
ගෘහ උපකරණ අංශය	
සහකාර කළමනාකරු	එන්. පී. රණසිංහ මෙනවිය
තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය	
සහකාර කළමනාකරු - විකුණුම්	එම්. ටී. බණ්ඩාර මහතා
විදුලි හා විද්‍යුත් උපකරණ අංශය	
කළමනාකරු	කේ. ජී. සී. ජනක මහතා
කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හා උපකරණ අංශය	
සහකාර කළමනාකරු	මධුශානි අකුරුගොඩ මිය
ඉදිකිරීම්, ලෝහ භාණ්ඩ සහ කාර්යාල ගෘහභාණ්ඩ අංශය	
සහකාර කළමනාකරු	අනුරුද්ධ මහේෂ් මහතා
වාහන නිපැයුම් අංශය	
වැඩබලන සහකාර කළමනාකරු	ටී. එච්. සුනේත්‍රා චන්ද්‍රකාන්ති මිය
පාරිභෝගික භාණ්ඩ අංශය	
කණිෂ්ඨ විධායක නිලධාරී	ඩී. පී. කුමාර මහතා

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අංශ ප්‍රධානීන්

අංශ ප්‍රධානීන්	නම
විශේෂ ව්‍යාපෘති සහ අලෙවි	
සහකාර කළමනාකරු	මිහිරි හේරත් මිය
ප්‍රදර්ශනාගාර මෙහෙයුම්	
කළමනාකරු	කේ. එල්. පතිරණ මහතා
තීරු බදු රහිත වෙළඳ අංශය	
සහකාර කළමනාකරු	කේ. ජී. සී. ජනක මහතා
ප්‍රසම්පාදන අංශය	
වැඩ බලන ජ්‍යෙෂ්ඨ කළමනාකරු	නිරෝෂ් බණ්ඩාර මහතා
කළමනාකරු	ඩී. කේ. ජයසූරිය මිය
මූල්‍ය අංශය	
මූල්‍ය කළමනාකරු	අයි. කේ. පී. පී. පෙරේරා මිය
සහකාර කළමනාකරු	එන්. යූ. ඩී. අල්විස් මෙනෙවිය
සහකාර කළමනාකරු	පී. ආර්. ඩී. පීරිස් මිය
සහකාර කළමනාකරු	එම්. ඊ. ඉලිපන්ගමුව මෙනෙවිය
තොරතුරු තාක්ෂණ අංශය	
වැඩ බලන ජ්‍යෙෂ්ඨ කළමනාකරු	නිරෝෂ් බණ්ඩාර මහතා
සේවා සහ සැපයුම් අංශය	
සහකාර කළමනාකරු	කේ. එච්. අනුපමා පීරිස් මිය
ප්‍රවාහන අංශය	
සහකාර කළමනාකරු	ඒ. ආර්. මොහොමඩ් ෆස්නුන් මහතා
විගණන අංශය	
සහකාර අභ්‍යන්තර විගණක	එම්. මදුෂා අමාලි ඩයස් මිය
මානව සම්පත් හා නීති අංශය	
නීති නිලධාරිණී	එස්. ජී. ඒ. ගුණසේකර මිය
සහකාර කළමනාකරු - මානව සම්පත්	අනුරාධා දසනායක මිය
ශාඛා සහ ප්‍රදර්ශනාගාර	
01. නවම් මාවත ප්‍රදර්ශනාගාරය	අංක 100, නවම් මාවත, කොළඹ 02.
02. කුරුණෑගල ප්‍රදර්ශනාගාරය	අංක 243/3/1, පුත්තලම් පාර, කුරුණෑගල.
03. මහනුවර ප්‍රදර්ශනාගාරය	අංක 449, විලියම් ගොපල්ලව මාවත, නුවර.
04. මාතර ප්‍රදර්ශනාගාරය	අංක 11, YMCA ගොඩනැගිල්ල, දුම්රියපල පාර, මාතර.
05. අනුරාධපුර ප්‍රදර්ශනාගාරය	අංක 561-B, 38 4වෙනි පටුමග, අනුරාධපුර.
06. යාපනය ප්‍රදර්ශනාගාරය	අංක 127, MPCS ගොඩනැගිල්ල, කන්කසන්තුරේ පාර, යාපනය.
07. සෙයිලන්සිටි සාප්පු සංකීර්ණය	ආර්ථික මධ්‍යස්ථානය, නාරාහේන්පිට.
08. මඩකලපුව ප්‍රදර්ශනාගාරය	අංක 32A සහ 32B, නව කල්මුනේ පාර, මඩකලපුව.
09. Q Shop වෙළඳ ජාලය	
01) නවම් මාවත	අංක 100, නවම් මාවත, කොළඹ 02.
02) පදනම් ආයතනය	අංක 100, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

අපේ නිෂ්පාදන කළඹ



කාර්යාල සැපයුම් හා උපකරණ

ඩබල් A සහ අනෙකුත් ජායා පිටපත් කඩදාසි, පුවරු, කඩදාසි වර්ග, පොත්, ෆයිල් කවර හා ෆෝල්ඩර, ලියුම් කවර, කාර්යාල බෑග් සහ බ්‍රීෆ්කේස්, පෑන් සහ පැන්සල්, වයිට් බෝඩ්, සලකුණු කිරීමේ පෑන්, කතුරු, කඩදාසි කැපීමේ පිහි සහ කඩදාසි තිරු කිරීමේ යන්ත්‍ර, කැල්කියුලේටර, ස්ටේප්ලර් සහ සිදුරුකරන, සීඩී තැටි සහ ඩීවීඩී තැටි, යූඑස්බී ඩ්‍රයිව් සහ අනෙකුත් ලිපි ද්‍රව්‍ය.

ගෘහ උපකරණ

ඇළුමිනියම් භාණ්ඩ, පෝසිලේන් නිෂ්පාදන, නන්ස්ටික් මුළුතැන්ගෙයි භාණ්ඩ, සියලු ආකාරයේ පිරිසිදු කිරීමේ නිෂ්පාදන, ක්‍රීඩා භාණ්ඩ, සියලු ආකාරයේ ප්ලාස්ටික් නිෂ්පාදන, කෝප්ප සහ පීරිසි, හැඳි ගෑරුප්පු පිහි ආදිය සහ පිඟන් බඳු, කේතල සහ පෝග්ගු, රාක්ක සහ බන්දේසි, උණු වතුර බෝතල්, ජල පෙරණ සහ පිරිසිදුකාරක, කොට්ට, මෙට්ට සහ ඇඳ ඇතිරිලි, රබර් සහ කොහු පාපිසි, කිරුම් උපකරණ, වැහි කබා සහ කුඩ, අත්පිස්නා, කඩදාසි අත්පිස්නා, අනෙකුත් කඩදාසි නිෂ්පාදන සහ බිත්ති ඔරලෝසු.





තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන උපාංග

ලැප්ටොප් පරිගණක, ඩෙස්ක්ටොප් පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර, යුපීඑස්, ජායා පිටපත් යන්ත්‍ර, අනෙකුත් පරිගණක උපාංග.

විදුලි සහ විද්‍යුත් උපාංග

වායු සමීකරණ යන්ත්‍ර, KDK විදුලි පංකා, ඩිජිටල් කැමරා (නිශ්චල,විඩියෝ) සහ දීප්තිමත් ආලෝක බල්බ, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ තිර, ගෘහස්ථ හා එළිමහන් ස්පීකර, ඕඩියෝ ඇම්ප්ලිෆයර, මික්සර් සහ මයික්‍රොෆෝන, විදුලි උත්පාදක යන්ත්‍ර, ප්‍රවේශ පාලන පද්ධති, CCTV පද්ධති, ඇඟිළි සලකුණු යන්ත්‍ර, විදුලි පහන් (CFL, ෆ්ලොරසන්ට්) සහ හදිසි අවස්ථා ලාම්පු, දුරකථන, විදුලි රැහැන් ඇදීමේ උපාංග, අනෙකුත් විදුලි උපාංග.





අපේ නිෂ්පාදන කළඹ



වේගයෙන් අළෙවි වන පාරිභෝගික භාණ්ඩ

ගෙදර දොර සෞඛ්‍ය පවත්වා ගැනීමට අවශ්‍ය නිෂ්පාදන, පුද්ගල සනීපාරක්ෂක භාණ්ඩ සහ ආහාර වර්ග.

ටයර් සහ වාහන බැටරි

EXIDE
APOLLO DUNLOP PIRELLI
YOKOHAMA. NANKANG







කෘෂිකර්ම උපකරණ, යන්ත්‍රෝපකරණ මෙවලම් සහ ලෝහ භාණ්ඩ

කටු කම්බි, පඳුරු කපන යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර, වෑද්දුම් ට්‍රාන්ස්ෆෝමර, කැති සහ පිහි, සියලු වර්ගයේ බල මෙවලම්, සියලු වර්ගයේ අත් මෙවලම්, ජල පොම්ප, ආරක්ෂිත උපකරණ (හිස් ආවරණ, අත්වැසුම් සහ බූට් වර්ග), මුල්ලු, අලවංගු, සවල් සහ රේක්ක, පොලිතින් සීලර්, ධූමන යන්ත්‍ර.

අපේ නිෂ්පාදන කළඹ





අභ්‍යන්තර සැලසුම් නිර්මාණ සහ කාර්යාල ගෘහ භාණ්ඩ

වානේ ගෘහ භාණ්ඩ, (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක) දැව ගෘහ භාණ්ඩ (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක) මෙලමයින් ගෘහ භාණ්ඩ (පුටු, මේස, කබඩ්, කැබිනට්, පොත් රාක්ක)

රසායන ද්‍රව්‍ය

කර්මාන්ත රසායන ද්‍රව්‍ය, පරීක්ෂණාගාර රසායන ද්‍රව්‍ය, විශේෂ රසායන ද්‍රව්‍ය, තෝරා ගත් පුපුරණ රසායන ද්‍රව්‍ය






තීරු බදු රහිත සාප්පුව


විදේශිකයින් සඳහා අවශ්‍ය පහසුකම් සපයයි.

ව්‍යාපාර සමාලෝචනය

විකුණුම් වර්ධනය (රු. මිලියන)



ආදයම් බදුවලට පසු ශුද්ධ ලාභය (රු. මිලියන)



රැකියා උත්පාදනය

2016 - 2021

2016/2017 සිට 2020/2021 දක්වා රැකියා උත්පාදනය

2016 - 2017



මුළු සේවකයන් 425

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් **205**
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් **220**

2017 - 2018



මුළු සේවකයන් 452

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් **221**
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් **231**

2018 - 2019



මුළු සේවකයන් 436

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් **204**
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් **232**

2019 - 2020



මුළු සේවකයන් 398

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් **211**
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් **187**

2020 - 2021



මුළු සේවකයන් 374

- පරිපාලනය සහ ඒ ආශ්‍රිත අනෙකුත් සේවකයන් **169**
- වෙළඳ කටයුතු හා සම්බන්ධ සේවකයන් **205**

ආයතනික පාලනය

පාලන ව්‍යුහය සහ යහපත් ව්‍යාපාරික පරිචයන් යළි පණගැන්වීමට පසුගිය වසර තුළ කළමනාකාරිත්වය ප්‍රයත්න දරන ලදී. ඊට අමතරව, සංස්ථාව සතුව වෙනම විගණන අංශයක් ඇති අතර මනා පාලන පරිසරයක් සහතික කිරීම පිණිස අභ්‍යන්තර පාලන ස්ථාපිත කර තිබේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන වෙනම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබේ. රජයේ ප්‍රසම්පාදන පටිපාටි අනුව ප්‍රසම්පාදන යාන්ත්‍රණය අධීක්ෂණය සහ පාලනය පිණිස ටෙන්ඩර් මණ්ඩලයක් ස්ථාපිත කොට ඇත..

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ

සභාපති / ක.අ.
යෝගා පෙරේරා මහතා
(2020.01.22 දින සම්බන්ධ විය)

- **බී. ඒ. ටී. රුද්‍රිගු මහතා** අධ්‍යක්ෂ
- **ඩී. ඒ. හෙට්ටිආරච්චි මහතා** අධ්‍යක්ෂ
- **යූ. දිසානායක මහතා** අධ්‍යක්ෂ
- **ඩී. ජේ. විද්‍යානච්චි මහතා** අධ්‍යක්ෂ
- **ජී. දහනායක මහත්මිය** අධ්‍යක්ෂ
- **ටී. ඒ. ඩී. රංජිත් මහතා** අධ්‍යක්ෂ

විගණන කමිටු සාමාජිකයෝ

බී. ඒ. ටී. රුද්‍රිගු මහතා
කමිටුවේ සභාපති

- **ජී. දහනායක මහත්මිය** අධ්‍යක්ෂ
- **ඩී. ජේ. විද්‍යානච්චි මහතා** අධ්‍යක්ෂ

ව්‍යාපාර කළමනාකරණ මෙවලම් පැවැතීම



1) ආයතනික සැලැස්ම 2019/2021
2) වාර්ෂික වාර්තාව 2019/2020
3) STC ප්‍රසම්පාදන පටිපාටි
4) STC ක්‍රියාකාරී සැලැස්ම
5) STC නිෂ්පාදන කළඹ
6) STC පැතිකඩ
7) STC ණයට විකුණුම් ප්‍රතිපත්තිය
8) STC අනුමත සේවක සංඛ්‍යාව


විශේෂ මූල්‍ය සිදුවීම්

	2020/2021 (රු. 000)	2019/2020 (රු. 000)	වෙනස% ↑/↓
මෙහෙයුම්			
පිරිවැටුම	2,676,667	2,453,551	9%
පොළී සහ බදුවලට පෙර ඉපැයුම්	87,588	-50,720	-273%
බදු පෙර ලාභය	46,924	-125,231	-137%
බදු පසු ලාභය	50,776	-124,798	-141%
ශේෂ පත්‍රය			
ජංගම නොවන වත්කම්	482,498	427,851	13%
ජංගම වත්කම්	2,032,038	2,064,781	-2%
ජංගම වගකීම්	1,626,047	1,738,884	-6%
ජංගම නොවන වගකීම්	187,000	103,035	81%
ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිත	701,489	650,713	8%
මුදල් ප්‍රවාහය			
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල්	448,530	319,716	40%
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්	440,363	311,448	41%
ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල්	-26,303	69,825	-138%
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ශුද්ධ මුදල්	-336,044	-338,339	-1%
කොටසක් සඳහා දත්ත			
කොටසක ඉපැයුම්	7	-12	-158%
කොටසක ශුද්ධ වත්කම්	70.15	65.07	8%
හිමිකම් මත ඵලය (ROE)	0.07	-0.19	-138%
වත්කම් මත ඵලය (ROA)	0.02	-0.05	-143%
වැදගත් අනුපාත			
දළ ලාභ අනුපාතය	20%	17%	2%
ශුද්ධ ලාභ අනුපාතය	2%	-5%	7%
ක්ෂණික අනුපාතය	0.98	0.87	13%
ජංගම අනුපාතය	1.25	1.19	5%
තෝලන අනුපාතය	1.21	1.63	-26%

විශේෂ මූල්‍ය සිදුවීම් ප්‍රස්ථාරික නිරූපණය


පිරිවැටුම

වර්ෂය	(රු. මිලියන)
11/12	1872
12/13	2269
13/14	3052
14/15	3862
15/16	2949
16/17	3749
17/18	4334
18/19	3474
19/20	2454
20/21	2677




බදු පූර්ව ශුද්ධ ලාභය

වර්ෂය	(රු. මිලියන)
11/12	82
12/13	97
13/14	74
14/15	11
15/16	31
16/17	61
17/18	82
18/19	-32
19/20	-125
20/21	47




මුළු වත්කම

වර්ෂය	(රු. මිලියන)
11/12	2469
12/13	2059
13/14	2275
14/15	3051
15/16	2694
16/17	2650
17/18	2994
18/19	2796
19/20	2493
20/21	2515




ශුද්ධ වත්කම


වර්ෂය	(රු. මිලියන)
11/12	572
12/13	640
13/14	686
14/15	695
15/16	707
16/17	759
17/18	820
18/19	786
19/20	651
20/21	701



කොටසක ඉපැයුම් (රු)




හිමිකම් මත ඵලය(රු.)



සංස්ථාවේ අංශයන්හි කාර්යසාධනය

ආදායම් උත්පාදකයන් 2020 - 2021




ආදායම් උත්පාදකයන්ගේ කාර්යසාධනය 2020/2021

අංශය	ආදායම	දළ ලාභය	දළ ලාභය%
රසායන ද්‍රව්‍ය	707,639,942	227,575,716	32%
තො.ස.තා.	422,694,685	53,083,563	13%
කාර්යාලීය සැපයුම්	269,930,142	55,258,010	20%
මෝටර් රථ අංශය	174,607,133	22,138,786	13%
තීරු බදු රහිත සාප්පුව	19,500,636	5,667,377	29%
විද්‍යුත් සහ විදුලි උපකරණ	173,558,668	30,872,105	18%
විශේෂ ව්‍යාපෘති අංශය	340,321,776	45,235,745	13%
ගෘහ උපකරණ	136,380,824	20,018,821	15%
ඉදිකිරීම් ද්‍රව්‍ය	195,816,466	23,865,860	12%
කෘෂි යන්ත්‍රෝපකරණ හා උපකරණ	141,611,771	26,653,450	19%
බැටරි අංශය	77,757,387	10,006,610	13%
අත්‍යවශ්‍ය ආහාර	16,526,407	2,276,436	14%
වෙන් නොකළ	321,523	54,243	17%
එකතුව	**2,676,667,360**	**522,706,722**	**20%**


වෙළඳ අංශ කාර්යසාධනය සංසන්දනය (2019-2020 / 2020-2021)

අංශය	2019/2020 (රු.)		දළ ලාභය%	2020/2021 (රු.)		දළ ලාභය%	% ↑ / ↓		
	විකුණුම්	දළ ලාභය		විකුණුම්	දළ ලාභය		විකුණුම්	ද.ලා	ද.ලා%
ර.ද්‍ර	572,889,249	206,160,829	36%	707,639,942	227,575,716	32%	24%	10%	-4%
තො.ස.තා	372,471,384	35,457,449	10%	422,694,685	53,083,563	13%	13%	50%	3%
කා.සැ.	468,223,618	59,867,392	13%	269,930,142	55,258,010	20%	-42%	-8%	8%
මෝටර් රථ	227,409,516	22,103,287	10%	174,607,133	22,138,786	13%	-23%	0%	3%
තී.බ.ර. සාප්පුව	11,320,984	3,064,006	27%	19,500,636	5,667,377	29%	72%	85%	2%
වි.වි. උපකරණ	182,491,192	28,345,817	16%	173,558,668	30,872,105	18%	-5%	9%	2%
වි.ව.අ.	46,095,340	4,784,837	10%	340,321,776	45,235,745	13%	638%	845%	3%
ගෘ.උ	131,532,906	19,101,552	15%	136,380,824	20,018,821	15%	4%	5%	0%
ඉ.ද්‍ර	198,623,913	17,061,662	9%	195,816,466	23,865,860	12%	-1%	40%	4%
කෘෂි. යන්ත්‍ර හා උප.	127,044,683	13,316,631	10%	141,611,771	26,653,450	19%	11%	100%	8%
බැටරි අංශය	113,449,485	13,500,120	12%	77,757,387	10,006,610	13%	-31%	-26%	1%
අත්‍යවශ්‍ය ආහාර	-	-	0%	16,526,407	2,276,436	14%	-	-	-
වෙන් නොකළ	1,998,559	286,165	14%	321,523	54,243	17%	-84%	-81%	-3%
එකතුව	**2,453,550,870**	**423,049,748**	**17%**	**2,676,667,360**	**522,706,722**	**20%**	**9%**	**24%**	**2%**

වෙළඳ අංශයන්හි ආදායම් සංසන්දනය



වෙළඳ අංශයන්හි දළ ලාභ සංසන්දනය



මගේ අංකය: TAC/D/STC/FA/2020/21/36 **ඔබේ අංකය:** **දිනය: 09 මැයි 2022**

සභාපති,
ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව,

ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ("සමාගම") 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අවම වශයෙන් සෑම වසර තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතුය. කෙසේ වෙතත්, පිරිවැය පිළිවෙළින් රු. 226,240,000, රු. 52,123,790, රු. 38,335,095, රු. 62,579,382, රු. 3,902,500 සහ රු. 77,861,358 ක් වූ ඉඩම්, ගොඩනැගිලි, කාර්යාලීය උපකරණ, පරිගණක, මෙවලම් හා උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් 2012 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද, වටිනාකම රු. 86,209,348 ක් වූ වාහන කිසිවිටෙක ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 41ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ හඳුනා නොගන්නා අවස්ථාවන්හිදී ප්‍රත්‍යාගණන සංචිත රඳවාගත් ඉපැයුම්වලට මාරු කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේදී අපහරණය කර තිබුණු වත්කම්වලට අදාළ ප්‍රත්‍යාගණන ලාභය රඳවාගත් ඉපැයුම්වලට මාරු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 50 වන ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් එහි ඵලදායී ජීවිත කාලය මත පදනම් විය යුතුය. කෙසේ වෙතත්, වත්කම් මිලදී ගැනීමේදී හා අපහරණය කිරීමේදී සමාගම එම ප්‍රමිතිය අනුව කටයුතු කර නොතිබුණි. ප්‍රමිතියට අනුකූල නොවීම හේතුවෙන් ක්ෂය රු. 705,380 ක් වැඩියෙන් දැක්වුණ අතර එම අගයෙන් ශුද්ධ ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (ශ්‍රී.ල.ගි.ප්‍ර. 16) 51 ඡේදයට අනුව, අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කළ යුතු අතර එය පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 8 ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, දැනටමත් භාවිතයේ පවතින රු. 166,634,752 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 හි 4 වන ඡේදය ප්‍රකාරව පරිගණක මෘදුකාංග, අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, රු.14,491,580 ක් වටිනා පරිගණක මෘදුකාංග දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, මෙම වත්කම්වල ශුද්ධ පොත් අගය ශූන්‍ය විය.

මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම වාර්තාවේ අනෙකුත් තොරතුරු යන්නෙන් සඳහන් වන්නේ 2020 වර්ෂය සඳහා වන ආයතනයේ වාර්ෂික වාර්තාවේ තොරතුරු වන නමුත් මෙම වාර්ෂික වාර්තාවේ හෝ මාගේ විගණන වාර්තාවේ සඳහන් නොවන කරුණුයි. මෙම කරුණු ඒ මත සැකසූ මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා දී ඇත්නම් කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරැදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ

නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව,සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වංචාවන් සඳහා වන සාවද්‍ය ප්‍රකාශයන් හඳුනා නොගැනීමෙන් වන අවධානම, ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය, හෙළිදරව් කිරීම් සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2)(ඇ) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ 151වන වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා සමඟ අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ස) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ,පහත සඳහන් නිරීක්ෂණ හැර ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති විධාන සඳහා යොමුව	විස්තරය
(අ) අංක අමප /20/1909/313/035 හා 2020 දෙසැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය	2021 සැප්තැම්බර් 21 දින වන විට රු. 50,000,000 ක ඇස්තමේන්තුවක් යටතේ Q- shop 20 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර 8 ක් ඉදිකර තිබුණි. ඒ අතරින් අලෙවිසැල් 5ක් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා දරන ලද පිරිවැය රු. 10,872,604 ක් විය.
(ආ) අංක පීඊඩී 12 දරන 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය (i) 6.5 ඡේදය	මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ මූදල් වර්ෂය අවසන් වී මාස 6කට පසුවය. තවද, මූල්‍ය ප්‍රකාශන සමග සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, එය ඉදිරිපත් කර නොතිබුණි.
(ii) 9.10 ඡේදය	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් නිලධාරීන් 19 දෙනෙකුට රු. 2,170,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි.
(ඇ) අංක පීඊඩී 1/2015 (i) දරන 2016 ඔක්තෝබර් 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	චක්‍රලේඛ විධිවිධානවලට පටහැණිව නිල වාහන භාවිතයට හිමිකම් නොලබන නිලධාරීන් 44 දෙනෙකු සඳහා එකතුව රු. 3,262,500 ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව දැනුවත් කිරීම සඳහා සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 පහත අවස්ථා හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් රු. 2,104,858 ක තොග විචල්‍යතාවයක් වාර්තා කර තිබුණි. මෙම විචල්‍යතාවයට තොග සත්‍යාපනයේ අතිරික්ත හා ඌනතාවල ශුද්ධ අගය හා තොග අගය කිරීමේදී ඇතිවන විචල්‍යතාවය ඇතුළත් විය. කෙසේ වෙතත්, අතිරික්ත හා ඌන ශේෂ වෙන් වෙන්ව හඳුනා ගැනීමට නිසි යාන්ත්‍රණයක් නොමැති අතර ඌන ශේෂයන්ගෙන් ඇති වූ පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගෙන නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර සමාගමේ ගිණුම් පද්ධතිය නවීකරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගෙන තිබුණි. කෙසේ වෙතත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය අනුව සමාගම කොන්ත්‍රාත්කරු සමග ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (අ) වගන්තිය අනුව කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. 2017 දෙසැම්බර් 18 දින රු. 1,805,500 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණ ද, මෙම වාර්තාවේ දිනය වන විට ප්‍රතිග්‍රහන ලිපියේ එකඟ වූ ක්‍රියාකාරකම් 12 කින් එකදු ක්‍රියාකාරකමක් හෝ සම්පූර්ණ කර නොතිබුණ අතර එම ගෙවූ මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබුය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

2.5 අනෙකුත් කරුණු

(අ) භාණ්ඩ මිලදී ගැනීමේදී ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු රු.52,443,263 ක් වූ අත්තිකාරම් ණයගැති ශේෂය යටතේ සෘණ ශේෂයක් ලෙස ඇතුලත් කර තිබුණි. පසුව මෙම අත්තිකාරම් ශේෂ පියවා නොතිබුණු අතර හඳුනා නොගත් ශේෂ ලෙස දක්වා තිබුණි. වයස් විශ්ලේෂණයට අනුව, මෙම අත්තිකාරම් වසර 2 සිට 5 දක්වා නොපියවා පවතී. කෙසේ වෙතත්, මෙම අත්තිකාරම් පියවීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) සමාගමේ මෙගා ප්‍රදර්ශනාගාරයේ කුලී වශයෙන් එකතුව රු. 4,972,320 ක් 2017 හා 2018 වර්ෂ තුළදී ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයට ගිවිසුමකින් තොරව ගෙවා තිබුණි. තවද, සමාගම මෙම ගොඩනැගිල්ල 2019 වසරේ සිට කිසිදු කුලී ගෙවීමකින් තොරව භාවිතා කර ඇත.

ඩබ්ලිව්. පී. සී.වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

2021 මාර්තු 31න් අවසන් වසර සඳහා

	සටහන්	2020 / 2021 රු.	2019 / 2020 රු.
ආදායම	03	2,676,667,360	2,453,550,870
විකුණුම් පිරිවැය		(2,153,960,638)	(2,030,501,124)
දළ ලාභය		522,706,722	423,049,746
අනෙකුත් මෙහෙයුම් ආදායම / (වියදම)	04	24,082,805	30,584,532
		546,789,527	**453,634,278**
බෙදා හැරීමේ වියදම්	05	57,043,238	93,149,348
පරිපාලන වියදම්	06	388,699,840	407,274,485
		445,743,078	**500,423,833**
පොළී සහ බදුවලට පෙර ඉපැයුම්		**101,046,449**	**(46,789,555)**
ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම)	07	(40,664,640)	(74,510,756)
බදුකරණයට පෙර ලාභය/(අලාභය)		**60,381,809**	**(121,300,311)**
බදුකරණය	08	7,082,130	1,375,474
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)		**67,463,939**	**(119,924,837)**
අනෙකුත් විස්තීරණ ආදායම			
සේවක ප්‍රතිලාභ මත ලාභ/(අලාභ)		(13,458,113)	(3,930,317)
අනෙකුත් විස්තීරණ ආදායම මත බදු		(3,229,947)	(943,276)
අනෙකුත් විස්තීරණ ආදායම - බදු අයකල පසු		-	-
වර්ෂය සඳහා සමස්ථ විස්තීරණ ආදායම - බදු අයකළ පසු		**(16,688,061)**	**(4,873,593)**
		50,775,878	**(124,798,430)**
කොටසක් සඳහා මූලික ඉපැයුම්	09		
		7	(12)

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිළි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් සම්පාදනය කරයි.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

2021 මාර්තු 31න් අවසන් වසර සඳහා

වත්කම්	සටහන්	2020 / 2021 රු.	2019 / 2020 රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	10	454,518,102	402,165,193
කොටස් වල ආයෝජන	11	20	20
සේවකයන්ට ලබා දුන් ණය	12A	12,258,615	13,016,948
පහසු ගෙවීමේ ණය යෝජනා ක්‍රමය	12B	9,228	809,167
ශුද්ධ විලම්භිත බදු වත්කම	17	15,711,660	11,859,477
මුළු ජංගම නොවන වත්කම්		**482,497,625**	**427,850,805**
ජංගම වත්කම්			
තොග	13	433,059,829	548,736,369
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	14	635,904,213	652,479,938
සේවකයන්ට ලබා දුන් ණය - වත්මන් කල් පිරීම	12A	5,964,270	5,905,330
පහසු ගෙවීමේ ණය යෝජනා ක්‍රමය	12B	786,777	2,010,039
ස්ථාවර තැන්පතුවල කෙටිකාලීන ආයෝජන		589,853,940	542,904,431
කෙටිකාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - මහජන බැංකුව		323,119,498	281,840,823
කෙටිකාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - ජා.ස. බැංකුව		614,543	8,055,588
මුදල් හා මුදලට සමාන දෑ	15	42,734,983	22,848,856
මුළු ජංගම වත්කම්		**2,032,038,053**	**2,064,781,374**
මුළු වත්කම්		**2,514,535,678**	**2,492,632,179**

ස්කන්ධය සහ වගකීම		**2020 / 2021**	**2019 / 2020**
		රු.	**රු.**
ප්‍රාග්ධන සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු.10 සාමාන්‍ය කොටස් මිලියන 10)		100,000,000	100,000,000
පොදු සංචිත		45,607,646	45,607,646
ප්‍රත්‍යාගණන සංචිත		241,108,234	241,108,234
අනෙකුත් සංචිත		(34,192,676)	(17,504,616)
රඳවාගත් ඉපැයුම්		348,965,936	281,501,998
මුළු ස්කන්ධ		**701,489,140**	**650,713,263**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	16	46,296,906	35,156,945
රජයේ ප්‍රදාන සහ විලම්භිත ආදායම් ගිණුම	21	139,392,638	50,944,377
දිගුකාලීන ණය ගැනුම්	18	1,310,000	16,934,000
මුළු ජංගම නොවන වගකීම්		**186,999,544**	**103,035,322**
ජංගම වගකීම්			
කෙටිකාලීන ණය ගැනුම්	18	571,149,623	708,776,886
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	19	781,272,588	698,351,859
බැංකු අයිරා	20	273,624,781	331,754,848
මුළු ජංගම වගකීම්		**1,626,046,992**	**1,738,883,593**
මුළු ස්කන්ධ සහ වගකීම්		**2,514,535,678**	**2,492,632,179**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිළි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි මූලික කොටස් බව සලකන්න. (වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතා සමග අනුකූල වේ.

.....
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලදී.

.....
සභාපති

.....
අධ්‍යක්ෂ

14.12.2021
.....
දිනය

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2021 මාර්තු 31න් අවසන් වසර සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	පොදු සංචිත රු.	අනෙකුත් සංචිත රු.	රඳවාගත් ලාභය/අලාභය රු.	එකතුව රු.
2019 අප්‍රේල් 1 වැනි දිනට ශේෂය	100,000,000	241,108,234	45,607,646	(12,631,022)	412,316,835	786,401,693
පෙර වසරේ ගැලපුම	-	-	-	-	110,000	110,000
වසර සඳහා ශුද්ධ ලාභය/(අලාභය)	-	-	-	-	(119,924,837)	(119,924,837)
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභ/(අලාභ)	-	-	-	(4,873,593)	-	(4,873,593)
යෝජිත ලාභාංශය (දළ)	-	-	-	-	(11,000,000)	(11,000,000)
2020 මාර්තු 31 දිනට ශේෂය	**100,000,000**	**241,108,234**	**45,607,646**	**(17,504,616)**	**281,501,998**	**650,713,264**
2020 අප්‍රේල් 01 දිනට ශේෂය	100,000,000	241,108,234	45,607,646	(17,504,616)	281,501,997	650,713,263
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)					67,463,939	67,463,939
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ශුද්ධ ලාභ/(අලාභ)	-	-	-	(16,688,061)	-	(16,688,061)
2021 මාර්තු 31 දිනට ශේෂය	**100,000,000**	**241,108,234**	**45,607,646**	**(34,192,676)**	**348,965,936**	**701,489,139**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිළි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි මූලික කොටස් බව සලකන්න.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 මාර්තු 31න් අවසන් වසර සඳහා

	2020 / 2021 රු.	2019 / 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	60,381,809	(121,300,311)
ගැලපීම්		
කල්බදු පොළිය	-	2,724
ක්ෂය වීම/ක්‍රමක්ෂය	38,436,869	32,981,970
පොළී ආදායම	(61,340,768)	(78,203,171)
කෙටිකාලීන ණය සහ අයිරා පොළිය	102,005,408	152,711,204
දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ ලාභය/(අලාභය)	(39,101)	(70,709)
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	1,296,000	1,152,000
ලියා හළ තොග සහ ණය	538,017	(244,178)
පෙර වසරේ ගැලපුම	-	110,000
යෝජිත ලාභාංශය	-	(11,000,000)
ණයගැති හානිය	(165,563)	452,651
තොග හානිය	6,160,722	24,860,434
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන	5,848,964	6,502,705
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	**153,122,357**	**7,955,318**
තොග භාණ්ඩ (වැඩිවීම)/ අඩුවීම	109,515,818	81,485,020
වෙළඳ ණයගැතියන් (වැඩිවීම)/අඩුවීම	11,783,737	246,822,449
රජයේ ප්‍රදාන විලම්බිත ආදායම (වැඩිවීම)/ අඩුවීම	88,448,261	11,370,000
පහසු ගෙවීම් ණය යෝජනා ක්‍රමයේ (වැඩිවීම)/ අඩුවීම	2,738,888	3,277,614
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම)	82,920,729	(31,194,222)
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්	**448,529,792**	**319,716,180**
ගෙවනු ලැබූ රඳවා ගැනීමේ බද්ද	-	(3,274,956)
ගෙවන ලද ආදායම් බදු	-	498,265
ගෙවනු ලැබූ පාරිතෝෂික	(8,167,116)	(5,491,284)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලදී යොදා ගත් ශුද්ධ මුදල්	**440,362,676**	**311,448,205**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම	(90,861,676)	(5,443,129)
බැහැර කිරීම්වලින් ලත් මුදල්	74,400	4,000
කෙටිකාලීන ආයෝජනවලින් ලැබුණු පොළිය	64,484,605	75,264,006
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්	**(26,302,671)**	**69,824,876**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
ස්ථාවර තැන්පතුවල ආයෝජන	(46,949,509)	(48,942,088)
කෙටිකාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - මහජන බැංකුව	(41,278,676)	(46,587,028)
කෙටිකාලීන අයෝජන - ගොඩ නැගූ ලාභාන්තිකය - ජා.ස. බැංකුව	7,441,045	(1,359,933)
ශුද්ධ ණය ආපසු ගෙවීම් සහ උත්පාදන	(153,251,263)	(88,566,401)
ගෙවන ලද කෙටිකාලීන ණය සහ අයිරා පොළිය	(102,005,408)	(152,711,204)
ගෙවන ලද කල්බදු කුලී	-	(172,643)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ	**(336,043,811)**	**(338,339,297)**
මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	78,016,194	42,933,784
වසර ආරම්භයේ දී මුදල් හා මුදලට සමාන දෑ	(308,905,992)	(351,839,776)
වසර අවසානයේ දී මුදල් හා මුදලට සමාන දෑ - (සටහන අ)	**(230,889,798)**	**(308,905,992)**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිළි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් සම්පාදනය කරයි.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

සටහන අ - මුදල් හා මුදලට සමාන දෑ විශ්ලේෂණය	31.03.2021 දිනට රු.	31.03.2020 දිනට රු.
බැංකුවේ ඇති මුදල්		
ලංකා බැංකුව (ගිණුම් අංක 8859546)	270,158	270,158
සම්පත් බැංකුව (ගිණුම් අංක 000930000337)	1,527,530	114,961
ලංකා බැංකුව (ගිණුම් අංක 1060)	20,097	20,097
මහජන බැංකුව - කුරුණෑගල	1,645,122	243,060
මහජන බැංකුව - මාතර	1,453,042	-
මහජන බැංකුව - මහනුවර	889,238	792,596
මහජන බැංකුව - පොළොන්නරුව	974,132	3,829,302
මහජන බැංකුව - කල්මුණේ	1,068,091	526,004
ජා.ස.බැ. (ගිණුම් අංකය - 101000160408)	-	15,357,749
අතැති මුදල්		
සුළු මුදල් අග්‍රිමය	657,273	607,248
අතැති මුදල්	34,230,299	1,087,680
බැංකු අයිරා		
සම්පත් බැංකුව - DFS (ගිණුම් අංකය - 002930006974)	(17,471,340)	(16,242,595)
මහජන බැංකුව - මාතර	-	(351,532)
මහජන බැංකුව (ගිණුම් අංකය - 004100120210918)	(235,770,839)	(315,160,721)
ජා.ස.බැ. (ගිණුම් අංකය - 101000160408)	(20,382,602)	-
	(230,889,798)	**(308,905,992)**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිළි කිරීමේ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් සම්පාදනය කරයි.
(වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීම් පෙන්නුම් කරයි)

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

1. පොදු විස්තරය

සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කොට ඇත.

මෙහි ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය අංක 100, නවම් මාවත, කොළඹ 02 යන ස්ථානයේ සිය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබයි.

ආයතනයේ ප්‍රධාන කර්තව්‍ය මෙහෙයුම් වෙළඳාම හා ප්‍රතිසම්පාදන කටයුතු වන අතර රාජ්‍ය අංශයේ ප්‍රධාන සැපයුම්කරුවෙකු ලෙස ද ආයතනය ක්‍රියා කරනු ලබයි.

2021 මාර්තු 31 වන දිනට ආයතනික ශ්‍රම බලකාය 374 කි. (2019/2020 - 398)

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය

2.1 පිළියෙළ කිරීමේ පදනම

2.1.1 අනුගතවීමේ ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ නව ප්‍රමිතීන්ට අනුකූලව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියාමයන්ට අනුකූල වන අයුරින් සකස් කොට ඉදිරිපත් කර ඇත.

2.1.2 ඉදිරිපත් කිරීමේ පදනම

පහත දැක්වෙන අයිතමයන් හැර අනෙකුත් සියළුම අයිතම ගෙනහැර දක්වා ඇත්තේ "ඓතිහාසික පිරිවැය පදනම" පදනම් කර ගනිමිනි.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුව, විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම වර්ථමාන අගයට පෙන්වා ඇත්තේ ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය පදනම් කර ගනිමිනි.

ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය සමාගම් කටයුතු අධීක්ෂණයෙන් පසුව ආයතනයේ කටයුතු අනාගත කාල පරිච්ඡේදයක් සඳහා කරගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගම සතු බව තහවුරු කර ඇත. එම නිසා අඛණ්ඩ පැවැත්ම නැමති සංකල්පය මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත.

2.1.3 සංසන්දනාත්මක විශ්ලේෂණය

පසුගිය වසර වල මූල්‍ය ප්‍රකාශන වල අදාල ශේෂයන් ජංගම වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලින් සනාථ කිරීම සඳහා අවශ්‍ය විටදී නැවත වර්ගීකරණය කොට දක්වා ඇත.

2.1.4 ඇස්තමේන්තු සහ තීරණාත්මක ගිණුම්කරණ විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුව පිළියෙල කිරීමේදී කළමණාකාරිත්වය විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතයට ගෙන ඇති අතර මෙමගින් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් කෙරෙහි සෘජු බලපෑමක් ඇති අවස්ථාවන්හි දී ප්‍රකාශයට පත් කරන ප්‍රකාශන සැබෑ තත්වයට වෙනස් විය හැකිය.

මෙම ඇස්තමේන්තු සහ උපකල්පන වාර්ෂිකව කළමණාකාරිත්වයේ සමාලෝචනයට පත්වන අතර එම අවස්ථාවන්හි දී ගිණුම්කරණ ඇස්තමේන්තු වලට සිදුකරන ලද ප්‍රතිශෝධන අදාල ගිණුම් වර්ෂයේ හදුනා ගැනීම සහ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම සහ ඉදිරි ගිණුම් වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවලට ගනු ලබයි.
සටහන් අංක 16 - ගිණුම් කිරීමේ නිශ්චිත විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම.

මූල්‍ය ප්‍රකාශන සඳහා බලපාන උද්ධමනකාරී සාධක වලට ගැලපීම් සිදු කර නොමැත.
වැදගත් සහ සුදුසු ප්‍රතිපත්තීන් ඉදිරි සටහන්වල ඉදිරිපත් කර ඇත.

2.1.5 විදේශීය මුදල් ගණුදෙනු පරිවර්තනය

(අ) ඉදිරිපත් කොට භාවිතයේ ඇති සහ ක්‍රියාකාරී මුදල් ඒකකය

විදේශ මුදල් ගණුදෙනු ගිණුම්ගත කිරීමේ දී අදාල ගණුදෙනුව සිදු වූ දිනට පැවති විදේශීය හුවමාරු අනුපාතය පදනම් කර ගනු ලබයි. අදාල ගණුදෙනු පියවීමේ දී ඇති වූ ලාභ හෝ අලාභ පරිවර්තනය කර ඇත්තේ වසර අවසානයේ පැවති හුවමාරු අනුපාතයන්ට අනුවයි. ආයතනයේ ගිණුම් පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි. මෙය ශ්‍රී ලංකාව තුල ක්‍රියාකාරිත්වය දරණ මුදල් ඒකකය වේ.

(ආ) ගණුදෙනු සහ ශේෂයන්

විදේශ මුදල් ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ දී අදාල දිනට පැවති විනිමය අනුපාතය අනුව ගලපා ගිණුම්වල දක්වා ඇත.

2.2 වත්කම් සහ ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම

2.2.1 දේපල, පිරියත සහ උපකරණ

2.2.2 හඳුනා ගැනීම සහ මිනුම් කිරීම

ආයතනය විසින් ගොඩනගා ගත් වත්කම්වල අගය පෙන්වා ඇත්තේ ඒ වෙනුවෙන් දරන ලද අමු ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ දරන ලද අනෙකුත් සෘජු වියදම් ද ඇතුලත්ව එම වත්කම් භාවිතයට ගත හැකි වන ආකාරයට පත් කර ගැනීමට දැරූ සියලු පිරිවැය ඇතුලත් අගයට වේ.

කිසියම් දේපල, පිරියත හා උපකරණ වර්ෂ කිහිපයක දී මිලට ගත් වත්කම් නම් එහි එලදායී පිව කාලය බෙදා දැක්වීම කළ යුත්තේ ප්‍රධාන සංඝටකවල පැවැත්ම පදනම් කර ගනිමිනි.

දේපල, පිරියත හා උපකරණවල සමුච්චිත ක්ෂය අගය අඩුකළ පසු අගය වාර්ෂික සමාලෝචනයට ලක්වන අතර කිසියම් වෙනස්කමක් සිදු වූව හොත් එම වෙනස්කමට අදාල පිරිවැය මත වූ ක්ෂය අගය අඩු කිරීමෙන් අනතුරුව එය ගෙන හැර දැක්වේ. එම ක්ෂය කල අගය අඩු කර නොහැකි අවස්ථාවල දී එම වත්කම මත වූ ක්ෂය ලියා හැර ඉන්පසු ඉතිරි වන අගය එම දේපල, එසේ නැත්නම් පිරියත, උපකරණ පොත් අගය ලෙස ගෙන හැර දක්වනු ලැබේ.

ඉඩම් හා ගොඩනැගිලි 2006 දී සිදු කළ ප්‍රත්‍යාගණන පදනම මත ගිණුම් ගත කර ඇත. කෙසේ වෙතත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව නැවත ප්‍රත්‍යාගණනය කලයුතු වූවත් එසේ කිරීමෙන් ධනාත්මක ප්‍රතිලාභ සිදු නොවේ නම් එසේ නොකිරීමෙන් මූල්‍ය ප්‍රමිතීන්ට කිසිදු අහිතකර බලපෑමක් සිදු නොවේ.

දේපල, පිරියත හා උපකරණවල සමුච්චිත ක්ෂය අගය අඩු කළ පසු අගය වාර්ෂික සමාලෝචනයට ලක්වන අතර කිසියම් වෙනස්කමක් සිදු වූවහොත් එම වෙනස්කමට අදාල පිරිවැය මත වූ ක්ෂය අගය අඩු කිරීමෙන් අනතුරුව එය ගෙනහැර දැක්වේ. එම ක්ෂය කළ අගය අඩු කළ නොහැකි අවස්ථාවල දී එම වත්කම මත වූ ක්ෂය ලියා හැර ඉන්පසු ඉතිරි වන අගය එම දේපල එසේත් නැත්නම් පිරියත උපකරණ පොත් අගය ලෙස ගෙනහැර දක්වනු ලැබේ.

ආයතනය සතු ඉඩම් සාධාරණ අගය අනුව ගෙනහැර දක්වනු ලබන අතර ඒ සඳහා වාර්ෂිකව සමුච්චිත ක්ෂය අගයක් සටහන් කරනු නොලැබේ. ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමේ දී එහි අගයේ වැඩි වීමක් සිදු වී නම් ආදායම් ප්‍රකාශයේ දක්වනු ලබන අතර එය හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන සංචිතයෙහි දැක්වේ. අගය අඩු වීම ද මෙයට ප්‍රතිවිරුද්ධ අයුරින් මෙලෙස සටහන් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

2.2.3 පසුව සිදුවූ පිරිවැය

දේපල, පිරියත හා උපකරණයන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද පිරිවැය හේතුවෙන් එහි ඵලදායී ජීව කාලය වැඩි වන්නේ නම්, එහි අගය ගණනය කළ හැකි නම් එවැන්නක් ගිණුම්ගත කරනු ලබන අතර එය ප්‍රාග්ධන ව්‍යයදමක් ලෙස ගෙනහැර දැක්වේ. දේපල, පිරියත හා උපකරණ දෛනික භාවිතයේ දී සිදුවන ව්‍යදම් ගෙන දක්වනු ලබන්නේ ආයතනයේ ආදායම් ප්‍රකාශයෙහි වේ.

2.2.4 නොහඳුනා ගැනීම

දේපල, පිරියත හා උපකරණයන්හි ධාරණ පිරිවැය හඳුනා ගන්නා අතර එම වත්කම සඳහා ආර්ථික වටිනාකමක් නොමැති අවස්ථාවන්හි දී හෝ භාවිතයෙන් ඉවත් කර ඇති විට දී එය ආයතනය විසින් බැහැර කෙරේ. එහි දී ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයෙහි දැක්වේ.

2.2.5 ක්ෂය

ආයතනයේ දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීමේ දී එය ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබන්නේ, "සරල මාර්ග ක්‍රමය" යටතේ පිරිවැය හෝ ප්‍රත්‍යක්ෂිත වටිනාකමෙන් සුන්බුන් අගය අඩු කර ඵලදායී ජීවිත කාලය පුරාවට බෙදා හැරීමෙනි. ලීසිං පහසුකම් යටතේ ඇති වත්කම් ක්ෂය කරනු ලබන්නේ ලීසිං පහසුකම් සලසනු ලබන හෝ එම වත්කමේ ජීව කාලය යන අයිතම දෙකෙන් අඩු කාල සීමාවටයි. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්මන් සහ සංසන්දනාත්මක කාල සීමාවන් සඳහා ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය සහ ක්ෂය අනුපාත පහත දැක්වෙන පරිදි වේ.

ගොඩනැගිලි	7.5%
රථවාහන	20%
කාර්යාල උපකරණ	10%
ගෘහ භාණ්ඩ/සවිකිරීම්	10%
පරිගණක මෙවලම්	33.33%
බදුකර වත්කම් මත ව්‍යදම් දැරීම	කල්බදු කාල සීමාව හෝ ගොඩනැගිලි ක්ෂය කළ හැකි කාල සීමාව යන දෙකින් වඩා අඩු කාල සීමාව.

සෑම වසරකම ක්ෂය කරනු ලබන ක්‍රමය සහ අයිතමයන්ගේ ජීව කාලය සමාලෝචනය කර කළමනාකාරිත්වය විසින් මූල්‍ය වාර්තාවල ගෙනහැර දක්වනු ලබයි.

2.2.6 මූල්‍යමය ව්‍යුත්පන්න වත්කම් වර්ගීකරණය

ආයතනය මූල්‍යමය වත්කම් මෙසේ ගෙනහැර දක්වනු ලබයි. සාධාරණ අගය මත ලැබිය යුතු දෑ ලෙස සහ විකිණීම සඳහා කල්පිරුණු පසුව යන අයුරින් මෙම ඉදිරිපත් කිරීම සිදුවේ. කළමනාකාරිත්වය එම වත්කම් ප්‍රථමයෙන් ඉහත ලෙස වර්ගීකරණය කරනු ලබන අතර ආයතනය තුළ මෙම වර්ෂය තුල දී කිසිදු මූල්‍යමය වත්කමක් නොවීය.

2.2.7 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ මූල්‍යමය වත්කම් ලෙස දැක්වෙන අතර මෙම අයිතමවල වටිනාකම නිශ්චය කිරීමට වෙළඳපොල වටිනාකම් ගත නොහැක්කේ එය ක්‍රියාකාරී වෙළඳපොල තුළ සංසරණය නොවන බැවිනි. මෙම වත්කම් ජංගම වත්කම් වන අතර මාස 12 ට වැඩි කාලයකින් පසු කල් පිරෙන්නේ නම් ජංගම නොවන වත්කම් ගණයට අයත් වේ. ආයතනයේ ණය සහ ලැබිය යුතු දෑ, "වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ" ගෙන්ද සමන්විතයි. තවද මුදල් හා මුදල් වලට සමාන දෑ ද මෙහි පිළිඹිබු වේ.

2.2.8 මූල්‍ය මෙවලම් හිලව් කිරීම

මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් හිලව් කොට මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනු ලබන්නේ එහි ශුද්ධ වටිනාකම අනුව වන අතර මෙසේ සිදු කිරීමේ අරමුණ වන්නේ මූල්‍යමය වත්කම් හා මූල්‍යමය වගකීම් අගයන් එකවිට හිලව් කිරීමයි.

2.2.9 මූල්‍ය වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැය මත වත්කම්

ගිණුම්කරණ වර්ෂ අවසානයේ දී ආයතනයේ මූල්‍ය වත්කම්හි අගයේ හානිකරණයක් වීද යන වග සමාලෝචනය කරනු ලබයි. මෙහි දී හානිකරණය වීමට යම්කිසි හේතුදාමයක් සිදුවිය යුතු අතර අවක්ෂේපිත සාධකද මේ සඳහා තිබිය හැකියි. මෙමගින් ආයතනයේ මූල්‍ය වත්කම්වලට හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ මුදල් ප්‍රවාහයන්හට බලපෑමක් සිදුවිය හැකි වේ.

මෙයට හේතු ලෙස ණයගැතියන්ට නැවත ගෙවීමේ නොහැකියාව, වස්තු භංගත්වය හෝ මූල්‍ය ප්‍රතිසංවිධාන කටයුතු දැක්විය හැකියි. තවද, ආර්ථික වාතාවරණය, මූල්‍ය ප්‍රවාහයන් අඩු වීම කෙරෙහි බලපෑ හැකි මූලික සාධකයක් වේ. ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ හි අලාභයන් මනිනු ලබන්නේ වත්කමේ දැන් පවත්නා අගය සහ අනාගත මුදල් ප්‍රවාහවල අගය වට්ටම් කිරීමෙන් ලැබෙන අගය ගැනීමෙනි. වත්කම් අගය අඩු වන්නේ නම් එය ආදායම් ප්‍රකාශයේ ගෙනහැර දැක්වේ.

2.2.10 අපහායනය මූල්‍ය නොවන වත්කම්

කාල නිර්ණයන් නොමැති වත්කම් ක්‍රමක්ෂය සිදු කරනු නොලබයි. නමුත් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කෙරේ. ඉහත සඳහන් වත්කම් හැර අනෙකුත් වත්කම් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂා කරනු ලබයි. එහි දී වටිනාකමේ ඇතිවන වෙනස් වීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වනු ලබයි.

2.2.11 තොග

I තොග අගය කරන්නේ පිරිවැය හෝ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයටයි. ශුද්ධ උපලබ්ධි අගය ගණනය කරන්නේ සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයන් යටතේ තොගය විකිණිය හැකි අගයෙන් පිරිවැය හා විකුණුම් ව්‍යදම් අඩු කිරීමෙන් පසුවය. මූල්‍ය වර්ෂය සඳහා තොග සත්‍යාපනය වර්ෂ අවසානයේ සිදු කර ඇති අතර හානි වූ තොගයන් හඳුනා ගෙන ඇත. ශුද්ධ ලැබිය හැකි වටිනාකම ගිණුම්ගත කර

II තොගයේ වටිනාකමෙන් විකුණුම් පිරිවැය ලෙස රු. 2,153,960,638 මෙම වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ගෙන දක්වා ඇත.

III වෙළඳ තොගය සඳහා 5% ක අපහායන අලාභ ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇති අතර වෙළඳ තොගයේ මුල් වටිනාකම ලබා ගැනීමට ආයතනයට නොහැකි බවට සාධනීය සාක්ෂීන් ඇති විට වසරකට වඩා වැඩි තොගයන් සහ හානියට පත් තොගය සඳහා 5% අපහායන වෙන් කිරීමක් ප්‍රතිපාදනය කර ඇත.

IV පහත සඳහන් මූල්‍ය ආයතනවලට තොග අගයන් ඇපකරණයන් වශයෙන් උකස් කර ඇත.

මූල්‍ය ආයතනයේ නම	උගස් වටිනාකම (රු.)
මහජන බැංකුව	116,500,000
සම්පත් බැංකුව	142,000,000
ජාතික සංවර්ධන බැංකුව	158,000,000

2.2.12 වෙළඳ ලැබිය යුතු දෑ

මෙම ලැබිය යුතු දෑ ආයතනය විසින් මූල්‍යමය වත්කමක් ලෙස ශේෂ පත්‍රයේ දක්වනු ලබන අතර ගිවිසුම් ප්‍රකාර බැඳීමක දී මුදල් හැර වෙනත් වත්කම් මගින් එය ලබා ගැනීම සඳහා ආයතනයට අයිතියක් ඇත. තවද, වසරකට වඩා වැඩි කාලයක් ගතවන විටදී වෙළඳ ලැබිය යුතු දෑ ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශවලට ඇතුලත් කර ඇත. තවද, බොල් ණය අදාල වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයේ සටහන් කෙරේ. තවද, අඩමාණ ණය සඳහා වෙන් කිරීමක්ද මූල්‍ය ප්‍රකාශනවල කරනු ලබන්නේ නිශ්චිත සාධක යම් අයුරකින් ඇත්නම් පමණි. මේ සඳහා ආයතනය විසින් ප්‍රමාණාත්මක වෙන් කිරීමක් සිදු කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

2.2.13 ආයෝජන

(අ) දීර්ඝ කාලීන ආයෝජන

දිගුකාලීන ආයෝජන ජංගම නොවන ආයෝජන ලෙස වර්ග කර ඇති අතර ඒවායේ අගය පිරිවැය වෙයි. ආයෝජන අත්පත් කර ගැනීමේ පිරිවැය (මිලදී ගැණුම් පිරිවැය, තැරැව් ගාස්තු, හුවමාරු ගාස්තු) ද ඇතුලත්ව මුළු පිරිවැය ගණනය කරනු ලැබේ.

(ආ) කෙටිකාලීන ආයෝජන

කෙටි කාලීන ආයෝජන ශේෂ පත්‍ර දිනට පැවති වෙළඳ අගයට හඳුනා ගනු ලබයි. කෙටිකාලීන ආයෝජනයන් හි ලාභ අලාභ ආදායම් ප්‍රකාශයට ගනු ලැබේ.

2.2.14 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ වලින් ගම්‍ය වන්නේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, ඉහල ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජන වේ. මෙහි දී මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී යොදා ගනු ලබන්නේ බැංකු අයිරාව හැර අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු පමණි.

2.2.15 ප්‍රකාශිත ප්‍රාග්ධනය

ආයතනයේ සියළුම කොටස් වල එකතුව එහි නාමික අගයෙන් වැඩි කිරීමෙන් ප්‍රකාශිත ප්‍රාග්ධනය ගණනය කොට ඇත.

මෙම ප්‍රකාශිත ප්‍රාග්ධනය පිළිබඳ හිමිකම, වගකීම දරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය සහ වෙළඳ අමාත්‍යාංශය මගින් වේ.

2.2.16 වෙළඳ ගෙවිය යුතු දෑ

සමාගම වෙළඳ ගෙවිය යුතු දෑ මූල්‍ය වගකීමක් සේ සලකනු ලබන අතර එය ශේෂ පත්‍රයේ ගෙවිය යුතු දෑ යටතේ සටහන් කරයි. මෙය සැපයුම්කරුවන් හා ඇති වූ ගණුදෙනු වල ප්‍රතිඵලයක් ලෙස ඇති වන්නා වූ මූල්‍ය වගකීමයි. සැපයුම්කරුවන්ගෙන් ලබාගත් භාණ්ඩ හා සේවා වෙනුවෙන් මුදල් හෝ තවත් එවැනි වත්කම් වලින් ආයතනය ගෙවිය යුතුය. වර්ෂයකට අඩු කාලයක දී ගෙවිය යුතු නම් ඒවා ජංගම වගකීම් වන අතර වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වේ නම් ඒවා ජංගම නොවන වගකීම් ගණයට අයත් වේ. වෙළඳ ණයහිමියෝ සාධාරණ අගය මත හඳුනා ගෙන ඇත.

2.2.17 ණය

ආයතනය ගනු ලබන ණය ප්‍රතිපාදන ප්‍රථමයෙන් සාධාරණ අගය මත හඳුනා ගනු ලබයි. පසුව මෙය ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගැනේ. තවද, වාර්ෂිකව සිදුකරනු ලබන ගෙවීම්, ආදායම් ප්‍රකාශයේ සටහන් වන අතර එහි වගකීම වසරකට වැඩි නම් ජංගම නොවන වගකීම් ලෙසත් වසරකට අඩු නම් ජංගම වගකීමක් ලෙසත් ශේෂ පත්‍රයේ දැක්වේ.

2.2.18 ආදායම් බදු

(අ) වර්තමාන බදු

වර්තමාන ආදායම් බදු ගණනය කර වෙන් කොට ඇත්තේ ව්‍යාපාරයේ මෙහෙයුම් අනුව 2006 අංක 10 දරණ ආදායම් බදු පනතේ නියමයන්ට අනුකූලවය.

(ආ) විලම්බිත බදු

විලම්බිත බදු තීරණය කරනු ලැබුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා සැලකිල්ලට ගනු ලබන වත්කම් හා බැරකම් වල ප්‍රමාණය, බදු වාර්තාකරණය සඳහා සැලකිල්ලට ගනු ලබන ප්‍රමාණය අතර තාවකාලිකව වෙනස මත ගණනය කිරීමෙනි. විලම්බිත බදු ගණනයේදී බදු ගාස්තු හා එයට අදාල නීති භාවිතයට ගෙන ඇත.

විලම්බිත බදු වත්කම් මත හඳුනා ගනු ලබන අතර එය ඉදිරි ගිණුම් වර්ෂවල දී ඇති විය හැකි ආයතනයේ ලාභය සමඟ හිලව් කොට දැක්වීම සඳහා භාවිත කරනු ලැබේ.

විලම්බිත බදු, බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීමේ දී නීත්‍යානුකූල බලාත්මක වන අයුරින් බදු වත්කම් බදු වගකීම් සමඟ හිලව් කෙරේ.

පමාකරන ලද බදු වත්කම සෑදී ඇත්තේ ආයතනයේ ඉදිරියට ගෙනෙන ලද බදු අලාභය හේතුවෙනි. මෙය ආයතනයේ ගිණුම් ප්‍රකාශවලට ගෙන නැත්තේ එය අය කරවා ගැනීමට සාමාන්‍ය බදු කාලසීමාවට වඩා කාලයක් ගතවන බැවිනි. මෙය සටහන්වල දක්වා ඇත.

(ඇ) පිරිවැටුම මත පදනම් වූ බදු

පිරිවැටුම මත පදනම් වූ බදුවලට එකතු කළ අගය මත බදු ඇතුලත් වේ.

2.2.19 සේවක ප්‍රතිලාභ මත වූ පිරිවැය

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම ලෙස හඳුන්වනු ලබන්නේ වෘත්තීය සේවා කාලය නිම වීමෙන් පසු ක්‍රියාත්මක වන නිශ්චිත දායකත්ව සැලසුම හැර අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලැස්මකි. ශේෂ පත්‍රයේ ආයතනික වගකීම නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මගින් ගණනය කොට ඇත්තේ 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා ගෙවීම පිළිබඳ පනතට අනුව වේ. සේවකයෙකු වෙත විශ්‍රාම දීමනා ගෙවීමේ වගකීම පැන නගිනුයේ වසර 5 ක පූර්ණ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුවය. මෙම වගකීම ගිණුම් ප්‍රකාශනවල හඳුනා ගෙන ඇත. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ හිඟය හෝ අතිරික්තය වර්ෂය සඳහා ගණනය කරනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 ට ප්‍රකාරව වන අතර යොදා ගත් උපකල්පන සටහන් අංක 17හි හෙළිදරව් කොට ඇත.

(ආ) සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

සියලුම සේවක, සේවිකාවන් අර්ථසාධක අරමුදල යටතේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල යටතේ ලියාපදිංචි කොට ඇති අතර අදාළ වර්ෂයේ දී එම සේවක සේවිකාවන් සඳහා ගෙවිය යුතු දායක මුදල රෙගුලාසිවලට අනුව සම්පාදනය කොට ඇත .

සියලුම සේවකයින් සඳහා වූ අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සම්බන්ධ දායකත්වය වියදම් සිදු වූ ආකාරයට ලාභ අලාභ සැකසීමේ දී හඳුනා ගත හැක .

2.2.20 ආදායම් හඳුනා ගැනීම

(අ) භාණ්ඩ විකුණුම් ආදායම

භාණ්ඩයක් විකුණුම් ලෙස හඳුනා ගනු ලබන්නේ පාරිභෝගිකයා වෙත භාණ්ඩයේ අවධානම සහ අයිතිය හුවමාරු වන අවස්ථාවේ දීය.

(ආ) සේවා සැපයුම් ආදායම

සේවා විකුණුම්වලින් ලත් ආදායම හඳුනා ගනු ලබන්නේ සේවාවේ ප්‍රතිලාභ හුවමාරු වූ අවස්ථාවේ දී වන අතර එම ආදායම අදාල ගිණුම් වර්ෂයේ දී හඳුනා ගැනේ.

(ඇ) පොළී ආදායම

පොළී ආදායම හඳුනා ගනු ලබන්නේ මුදල් පදනම මත වේ.

(ඈ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් ද උපචිත පදනම මත හඳුනා ගනු ලබයි.

(ඉ) දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේ ලාභ

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේ ලාභ/අලාභ හඳුනා ගනු ලබන්නේ එය බැහැර කළ වර්ෂය තුලයි.

2.2.21 වියදම් හඳුනා ගැනීම

(අ) අයභාර වියදම්

සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ දී වියදම් හඳුනා ගනු ලබන්නේ ආදායම් ඉපැයීම සඳහා දැරූ පිරිවැය සහ එය මත සෘජු සම්බන්ධතාවය පදනම් කර ගැනීමෙනි.

එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා දරනු ලබන පිරිවැය, ප්‍රාග්ධන නඩත්තු වියදම් ආදිය මෙහෙය වීමේ වියදම්, ආයතනික වියදම් ආදී කටයුතුවල ඵලදායිතාවය ඉහල නංවමින් ආදායම් ඉපැයීම සඳහා සිදු කළ වියදම් අයභාර වියදම් ලෙස දැක්වේ. වර්ෂ අවසානයේ මෙහි ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට ගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

(ආ) ප්‍රාග්ධන වියදම්

ප්‍රාග්ධන වියදම් දරනු ලබන්නේ වත්කමේ ස්වභාවය වැඩිදියුණු කිරීමටයි. එනම් ඵලදායිතාවය වැඩි කිරීම සඳහා දරන වියදම් වේ. එසේම ව්‍යාපාරය ඉදිරියට පවත්වා ගෙන යාමට හෝ එහි පරිමාණය වර්ධනය කිරීමට සහ ව්‍යාපාරයේ පැවැත්ම සඳහා ප්‍රාග්ධන වියදම් දරනු ලැබේ.

(ඇ) ණය ගැනුම්

ආයතනය ප්‍රධාන ලෙස ණය මුදල් යොදා ඇත්තේ ආයතනයේ ප්‍රාග්ධන වත්කම් වැඩි කර ගැනීමට, ප්‍රතිග්‍රහනය සඳහා සහ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමටය. මෙහි දී ප්‍රාග්ධන වත්කම් වෙනුවෙන් යොදා ඇති වටිනාකම / තක්සේරු අගය අදාල වත්කම් කාණ්ඩය යටතේ දක්වා ඇති අතර අනෙකුත් සියළුම ණය ගැණුම් ආදායම් ප්‍රකාශයේ ගලපා දක්වා ඇත. ණය ගැණුම් යටතේ පොළී සහ ණය සම්බන්ධ අනෙකුත් වියදම් ද දක්වා ඇත.

(ඈ) ශුද්ධ මූල්‍යමය ආදායම්/වියදම්

මූල්‍යමය ආදායම් ලෙස බැංකු තැන්පතු ආයෝජන සඳහා පොළිය, සේවක ණය නැවත ගෙවීම් සහ මූල්‍යමය වත්කම් වල සාධාරණ අගය වෙනස්වීම් ආදායම් ප්‍රකාශයන්හි සටහන් කරනු ලැබේ. පොළී ආදායම් සංචිත පදනම මත සාධනීය පොළී ක්‍රමය මත හඳුනා ගෙන ඇත.

මූල්‍යමය වියදම් ලෙස පොළී වියදම්/ගෙවීම්, මූල්‍යමය වත්කම් සාධාරණ අගය වෙනස් වීම්, (අපහයන අලාභ) සහ ආයතනයේ ප්‍රාග්ධන වත්කම් කෙරෙහි ඉදිකිරීම් ප්‍රතිග්‍රහනයට අයත් නොවන වත්කම් ආදායම් ප්‍රකාශයෙහි සාධනීය පොළී ක්‍රමය යටතේ හඳුනා ගෙන ඇත.

(ඉ) බොල් ණය සඳහා වෙන් කිරීම්

මෙම වෙන් කිරීම හඳුනා ගනු ලබන්නේ වර්තමාන නීතිමය වගකීමක් හෝ අතීතයේ ඇති වූ සමහර ගනුදෙනු පදනම් කර ගනිමිනි. මෙම ගණුදෙනු නිරවුල් කිරීමේ දී මුදල් ප්‍රවාහ ආයතනයෙන් පිටතට ගලායන අතර මේ සඳහා යොදා ගන්නා වූ උපක්‍රමයක් ලෙස ඇස්තමේන්තුවක් ඇති කිරීම සාමාන්‍යයෙන් සිදු කරයි. තනි තනි ශේෂ සියුම් ලෙස පරීක්ෂා කර බොල් ණය වියදම් හඳුනාගත යුතුය. එසේ හඳුනා ගන්නා පිරිවැය ආවරණය කර ගැනීම උදෙසා ආයතනය විසින් ප්‍රමාණාත්මක ඇස්තමේන්තුවක් ඇති කර ගත යුතුයි.

2.2.22 සම්බන්ධිත පාර්ශව ගණුදෙනු

ආයතනයේ හෝ වෙනත් පරිබාහිර තුන්වන පාර්ශවයක් විසින් කරන්නා වූ ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ආයතනයේ මූල්‍ය ප්‍රතිපත්ති හා තීරණවලට සැලකිය යුතු අන්දමේ බලපෑමක් කල හැකි නම් හා එසේ සිදු වී ඇති නම් ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කළ යුතුය. අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 22 මගින් හෙලිදරව් කරනු ලබයි.

ආස්ථිත්වයේ සම්බන්ධිත පාර්ශව

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරී සම්බන්ධිත ඒකකයන් කිසිවක් නොමැත.

2.2.23 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙම ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය"වක්‍ර ක්‍රමය අනුව" සකස් කර ඇත.

2.2.24 අංශ තොරතුරු

ආයතනය නියැලී සිටින ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ එහි ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළින් උපයන ආදායම, දරන ලද වියදම මෙහෙයුම් අංශ තුළ ඇතුලත් වේ. ආයතනයේ අනෙකුත් අංශවලින් සිදුවන ගණුදෙනු සමඟ මෙහෙයුම් අංශ ආදායම සහ වියදම හඳුනා ගනු ලබයි. අංශවල සම්පත් බෙදා හැරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ කාර්යසාධන තක්සේරු කිරීම සඳහා සියළුම මෙහෙයුම් අංශවල මෙහෙයුම් ප්‍රතිඵල ක්‍රමවත් ලෙස ආයතනයේ කළමණාකාරීත්වය විසින් සමාලෝචනයට ලක් කරනු ලබයි.

මේ සඳහා වෙන් වෙන්ව පවතින මූල්‍ය තොරතුරු ලබාගත හැකිය. මේ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ සටහනක් මගින් හෙලිදරව් කර ඇත.

2.2.25 කොටසක ඉපැයුම

සාමාන්‍ය කොටසක් වෙනුවෙන් හිමි ලාභාංශ ආයතනයේ වර්ෂය තුළ ඇති බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදූ කල කොටසක ඉපැයුම ලැබේ.

2.2.26 ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම්

ගිණුම් කාල පරිච්ඡේදයේ අවසන් දිනයත් මූල්‍ය ප්‍රකාශන අධිකාරී බලයෙන් යුතුව නිකුත් කරන දිනයන් අතර කාලසීමාවේ දී මූල්‍ය ප්‍රකාශන වලට බලපෑ හැකි සතුටුදායක හෝ අසතුටුදායක සිද්ධි ඇති විය හැකිය. මේවා ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් ලෙස හැඳින්වේ.

මෙම සිද්ධි සලකා බලා මූල්‍ය ප්‍රකාශනවල යම් සංශෝධනයන් අවශ්‍ය නම් ඒ සඳහා ප්‍රමාණාත්මක හෙලිදරව් කිරීමක් හෝ ගැලපීමක් අවශ්‍ය නම් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කල යුතුය. එලෙස සිදුවීම් හට ගෙන නොමැති නම් ඒ අවස්ථාවල දී ගැලපීමක් අවශ්‍ය නොවේ. තවද අදාල කාලය තුළ ආයතනයේ ගැලපිය යුතු හෝ සටහන් විය යුතු මූල්‍ය ප්‍රකාශන වලට බලපෑ කිසිදු හේතුවක් නොවීය.

2.2.27 වගකීම් සහ අවිනිශ්චිත සිදුවීම්

වාර්තාකරණ දිනට පැවති වගකීම් සහ අවිනිශ්චිත සිදුවීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 22 මගින් හෙළිදරව් කරයි.

2.2.28 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ ලෙස සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වූ වගකීම ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

මූල්‍ය ප්‍රකාශන වල හෝ ආයතනයේ වංචා හා වැරදි ඇත්නම් ඒවා සොයා ගෙන ඒවාට පිළියම් යෙදීම, අවශ්‍ය අවස්ථාවල දී නව ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ප්‍රමාණාත්මක ඇස්තමේන්තු ඇති කිරීම, තෝරා ගැනීම, භාවිතය සහ සමාලෝචනය කර අවශ්‍ය විටක සංශෝධනය කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 03 - ආදායම	2020 / 2021 රු.	2019 / 2020 රු.
දළ විකුණුම්	2,677,860,191	2,454,817,306
අඩු කළා : ආපසු එවුම්	(1,192,831)	(1,266,435)
ශුද්ධ විකුණුම් (සටහන 03.01)	**2,676,667,360**	**2,453,550,870**

සටහන 03.01 - වෙළඳ අංශ (ශුද්ධ විකුණුම්)	2020 / 2021 රු.	2019 / 2020 රු.
රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	707,639,942	572,889,249
තොග.ස.තා. නිපැයුම්	422,694,685	372,471,384
කාර්යාල සැපයුම්	269,930,142	468,223,618
රථ වාහන ටයර් අංශය	174,607,133	227,409,516
තීරු බදු නිදහස් ප්‍රදර්ශනාගාරය	19,500,636	11,320,984
විදුලි සහ විද්‍යුත් උපකරණ	173,558,668	182,491,192
විශේෂ ව්‍යාපෘති ඒකකය	340,321,776	46,095,340
ගෘහස්ථ උපකරණ හා මෙවලම්	136,380,824	131,532,906
ඉදිකිරීම්, ලෝහ උපකරණ හා මෙවලම්	195,816,466	198,623,913
කෘෂි උපකරණ හා යාන්ත්‍රික උපකරණ	141,611,771	127,044,683
ස්වශක්ති	77,757,387	113,449,485
අත්‍යවශ්‍ය ආහාර	16,526,407	-
වෙන් නොකළ (අනෙකුත්)	321,523	1,998,599
	2,676,667,360	**2,453,550,870**

සටහන 03.02 - අංශ ගත මෙහෙයුම් ප්‍රතිඵල (දළ ලාභ)	2020 / 2021 රු.	2019 / 2020 රු.
රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	227,575,716	206,160,829
තොග.ස.තා. නිපැයුම්	53,083,563	35,457,449
කාර්යාල සැපයුම්	55,258,010	59,867,392
රථ වාහන ටයර් අංශය	22,138,786	22,103,287
තීරු බදු නිදහස් ප්‍රදර්ශනාගාරය	5,667,377	3,064,006
විදුලි සහ විද්‍යුත් උපකරණ	30,872,105	28,345,817
විශේෂ ව්‍යාපෘති ඒකකය	45,235,745	4,784,837
ගෘහස්ථ උපකරණ හා මෙවලම්	20,018,821	19,101,552
ඉදිකිරීම්, ලෝහ උපකරණ හා මෙවලම්	23,865,860	17,061,662
කෘෂි උපකරණ හා යාන්ත්‍රික උපකරණ	26,653,450	13,316,631
ස්වශක්ති	10,006,610	13,500,120
අත්‍යවශ්‍ය ආහාර	2,276,436	-
වෙන් නොකළ (අනෙකුත්)	54,243	286,165
	522,706,722	**423,049,746**

සටහන 04 - අනෙකුත් මෙහෙයුම් ආදායම්	2020/ 2021 රු.	2019 / 2020 රු.
විනිමය මත ලාභ (අලාභ)	(7,818)	9,926
විවිධ ආදායම් (සටහන 04.01)	4,183,401	28,964
ඉපැයූ ආදායම සහ අනෙකුත් ආදායම් - ණය/කුලී පිට ගැනුම්	368,121	818,865
ස්ථාවර වත්කම් විකිණීම	39,101	70,709
ලැබුණු කුලිය - රාජගිරිය පරිශ්‍රය	19,500,000	24,000,000
ස්මාර්ට් වෙම් ටෙක්නොලජීස් - වට්ටම්	-	5,656,068
	24,082,805	**30,584,532**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

(සටහන 04.01) - විවිධ ආදායම	2020 / 2021 රු.	2019 / 2020 රු.
හානි වූ අයිතම විකිණීම	1,070,182	16,147
නිල ඇඳුම් ද්‍රව්‍ය විකිණීම	3,111,888	-
වෙනත්	1,332	12,817
	4,183,401	**28,964**

සටහන 05 - බෙදාහැරීමේ වියදම්	2020 / 2021 රු.	2019 / 2020 රු.
සාම්පල් වියදම්	2,546,668	1,964,386
ටෙන්ඩර් පත්‍රිකා	538,859	1,260,963
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ වියදම්	3,028,400	3,227,263
ගබඩා සහ ප්‍රදර්ශනාගාර කුලිය	24,372,995	25,684,383
ලොරි රථ කුලී/ප්‍රවාහන	1,392,818	1,746,149
සේවා කිරීම් ගාස්තු	1,242,629	686,512
විකුණුම් වියදම් ප්‍රතිපූරණය	13,453,665	17,128,972
ණය එකතුකිරීමේ වියදම් ප්‍රතිපූරණය	770,930	1,195,942
වෙළඳ ප්‍රදර්ශන වියදම්	-	50,000
බලපත්‍ර ගාස්තු - විකිණීම	208,793	442,734
විදේශ ගමන්	-	290,185
වෙළඳ ප්‍රවර්ධන වියදම්	615,099	508,852
දැන්වීම් ප්‍රචාරණය	2,213,606	1,397,755
තෑගි වවුචර්	-	100,000
භාණ්ඩ පැටවුම් සහ බෑමේ වියදම්	63,800	-
අය කළ නොහැකි චිකතු කළ අගය මත බදු	42,402	285,909
ජාතිය ගොඩනැගීමේ බද්ද	-	12,110,436
බොල් සහ අඩමාන ණය	570,787	100,715
ලියා හරින ලද තොග හෝ අනෙකුත් දෑ	(32,770)	(344,894)
ආයතනික ගනුදෙනුකරුවන්හට විකුණුම් ප්‍රවර්ධනය	19,400	-
තොග හානි අලාභ	6,160,722	24,860,434
ණයගැතියන්ගේ හානි අලාභ	(165,563)	452,651
	57,043,238	**93,149,348**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 06 - පරිපාලන වියදම්

	2020 / 2021 රු.	2019 / 2020 රු.
වැටුප්	132,369,778	131,397,862
සේ. අ. අ.	23,653,847	24,155,176
සේ. භා. අ.	4,730,749	4,829,555
අතිකාල සහ විශේෂ දීමනා	27,030,969	28,280,221
අලුත් අවරුදු උත්සව අත්තිකාරම්	11,310,000	4,889,000
කොන්ත්‍රාත් සහ අනියම් සේවක වැටුප්	40,699,090	49,856,981
කාර්යමණ්ඩල ප්‍රතිලාභ පිරිවැය	944,747	730,263
කාර්යමණ්ඩල සුභසාධනය	9,602,724	16,122,052
කාර්යමණ්ඩල වෛද්‍ය වියදම්	3,621,933	2,870,524
කාර්යමණ්ඩල වාහන සහ ඉන්ධන දීමනා	11,007,860	13,659,796
නිල ඇඳුම්	706,082	676,495
ශ්‍රම වියදම්	13,500	34,600
මරණ පාරිතෝෂිකය	200,000	350,000
ලබා නොගත් නිවාඩු සඳහා මුදල්	9,451,075	7,630,864
පාරිතෝෂික ප්‍රතිපාදනය	5,848,964	6,502,705
ගමන් සහ යැපීම් දීමනා	4,427,801	4,683,298
විගණන ගාස්තු	1,296,000	1,152,000
වෘත්තීමය සහ උපදේශන සේවා ගාස්තු	59,000	193,490
නෛතික ගාස්තු	745,155	384,270
ලේකම් කටයුතු සහ අනෙකුත් වියදම්	1,080,882	-
අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්	960,000	1,308,473
අධ්‍යක්ෂවරුන්ගේ දීමනා	583,000	195,500
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම්	47,720	8,698
රක්ෂණ - සාමාන්‍ය	1,067,184	1,544,296
වරිපනම් සහ බදු	3,110,117	1,592,996
බලපත්‍ර ගාස්තු	360,426	174,447
දුරකථන ගාස්තු	9,436,940	10,775,407
විදුලි ගාස්තු	16,666,292	17,194,744
තැපැල් ගාස්තු	871,467	1,746,531
ජල ගාස්තු	1,707,197	2,114,400
පුවත්පත් සහ වාර ප්‍රකාශන	29,070	192,900
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	8,250,478	8,016,638
නඩත්තුව - ගොඩනැගිලි	113,194	140,585
නඩත්තුව - කාර්යාල උපකරණ	8,251,338	9,671,994
නඩත්තුව - ගබඩා උපකරණ	2,484,459	448,270
නඩත්තුව - ප්‍රදර්ශනාගාර	9,695,083	12,324,474
නඩත්තු සහ අනෙකුත් වියදම් - රජවාස	1,352,922	-
නඩත්තු සහ අනෙකුත් වියදම් - Q Shop	1,232,428	-
නඩත්තුව - රථ වාහන	3,785,695	4,407,215
මෝටර් රථ වාහන ලියාපදිංචිය සහ රක්ෂණය	104,054	149,280
ඉන්ධන සහ ලිහිසි තෙල්	3,779,590	4,471,583
පරිගණක කළමනාකරණ ගාස්තු	80,400	295,312
පරිගණක නඩත්තුව	1,344,368	987,987
ක්ෂය කිරීම් - ගොඩනැගිලි	1,109,867	1,661,084
ක්ෂය කිරීම් - රථ වාහන	642,356	642,356
ක්ෂය කිරීම් - පිරියත හා උපකරණ	6,858,369	8,479,041
ක්ෂය කිරීම් - ලී බඩු	7,786,136	7,575,427
ක්ෂය කිරීම් - මෙවලම් හා උපකරණ	390,250	368,304
බදුකරයට ලබාගත් පරිශ්‍රයන් මත ඉදිකළ කාර්යාල/ප්‍රදර්ශනාගාර		
ක්ෂයවීම, රාජවාස ව්‍යාපෘතිය සහ Q-Shop ඉදිකිරීම්	7,285,925	7,887,710
වාහන කුලියට ගැනීම	502,553	3,923,328
කාර්යමණ්ඩල සංවර්ධන සහ පුහුණු වියදම්	5,000	174,822
අධිභාර	5,805	401,531
	388,699,840	**407,274,485**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 07 - ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම)	2020 / 2021 රු.	2019 / 2020 රු.
පොළී ආදායම		
කෙටිකාලීන තැන්පතු මත පොළී ආදායම	58,993,224	76,291,787
කාර්ය මණ්ඩල ණය මත පොළිය	1,402,797	1,181,121
පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ ප්‍රතිවර්තනය	944,747	730,263
	61,340,768	**78,203,171**
පොළී වියදම		
අයිරා පොළිය	26,688,521	35,846,718
කෙටිකාලීන භාර ණය පොළිය	68,856,117	106,765,628
උත්සව ණය පොළිය	60,592	-
කල්බදු පොළිය	-	2,724
බැංකු පොළිය	6,400,179	10,098,858
	102,005,408	**152,713,927**
	(40,664,640)	**(74,510,756)**

සටහන 08 - ආදායම් බදු වියදම	සටහන්	2020 / 2021 රු.	2019 / 2020 රු.
වර්ෂය සඳහා ලාභය මත ආදායම් බද්ද - 2020/2021	08.01	-	-
විලම්බිත බදු වියදම / (ප්‍රත්‍යාවර්තනය)	08.02	(7,082,130)	(1,375,474)
		(7,082,130)	**(1,375,474)**

(සටහන 8.1) ගිණුම්ගත ලාභය සහ ආදායම් බද්ද අතර සැසඳුම

මාරතු 31න් අවසන් වසර සඳහා	2020 / 2021 රු.	2019/ 2020 රු.
බදුකරණයට පෙර ගිණුම්කරණ ලාභය	60,381,809	(121,300,311)
ආයෝජන ආදායම	(78,493,224)	(100,291,787)
නොඉඩදුන් අයිතම එකතුව	50,296,428	65,414,492
ඉඩදුන් අයිතම එකතුව	(47,760,241)	(49,033,903)
ගලපන ලද ව්‍යාපාරික ලාභය	**(15,575,229)**	**(205,211,510)**
ආයෝජන ආදායම	78,493,224	100,291,787
ඉදිරියට ගෙනා බදු අලාභ උපයෝජනය	(78,493,224)	(100,291,787)
බදු අය කළ හැකි ආදායම	-	-
24% බැගින් වර්ෂය සඳහා ලාභ මත ආදායම් බද්ද	**-**	**-**

වාර්තාකරණ දිනයට ඉදිරියට ගෙනා උපයෝජනය නොකළ බදු අලාභය රු. 256,326,492/- ක් විය. (2019/20 - රු. 319,244,488/-).

(සටහන 8.2) විලම්භිත බදු වියදම / (ප්‍රත්‍යාවර්තනය)

විලම්බිත බදු වියදම / (ප්‍රත්‍යාවර්තනය) පැන නැගුණේ :	2020/ 2021 රු.	2019 / 2020 රු.
විලම්භිත බදු වත්කම් සඳහා වසර තුළ අය කිරීම/(ප්‍රත්‍යාවර්තනය)	(1,178,592)	(5,206,388)
විලම්භිත බදු වගකීම් සඳහා වසර තුළ අය කිරීම/(ප්‍රත්‍යාවර්තනය)	(2,673,591)	4,774,190
ආයුගණක අලාභ සඳහා වසර තුළ අය කිරීම/(ප්‍රත්‍යාවර්තනය)	(3,229,947)	(943,276)
	(7,082,130)	**(1,375,474)**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 09 - කොටසක් සඳහා ඉපැයුම්

කොටසක් සඳහා මූලික ඉපැයුම්

කොටසක් සඳහා මූලික ඉපැයුම් ගණනය කරනු ලබන්නේ කොටස් හිමියන්ට ආරෝපණීය ශුද්ධ ලාභය වසර තුළ නිකුත් කළ සාමාන්‍ය කොටස්වල භරිත සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීම මගිනි.

	2020 / 2021 රු.	2019 / 2020 රු.
කොටස් හිමියන්ට ආරෝපණීය ශුද්ධ ලාභය (රු. ශත)	67,463,939	(119,924,837)
නිකුත් කර ඇති සාමාන්‍ය කොටස්වල භරිත සාමාන්‍ය සංඛ්‍යාව	10,000,000	10,000,000
කොටසක් සඳහා මූලික ඉපැයුම්/(අලාභ) රු. ශත	**7**	**(12)**

කොටසක් සඳහා තනුක ඉපැයුම්

2021 මාර්තු 31න් අවසන් වූ වසර තුළ කිසිදු අවස්ථාවක නොපිය වූ තනුක භව්‍ය සාමාන්‍ය කොටස් නොතිබුණි. එබැවින් කොටසක් සඳහා තනුක ඉපැයුම් ඉහත වාර්තා කරන ලද කොටසක් සඳහා මූලික ඉපැයුම්වලට සමාන වේ.

සටහන 10 - දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය /ප්‍රත්‍යාගණනය	ඉඩම් රු.	ගොඩනැගිලි රු.	බදු පදනම් මත ලබාගෙන ඇති ගොඩනැගිලි රු.	මෝටර් රථ වාහන රු.	කාර්යාල උපකරණ රු.	පරිගණක රු.	මෙවලම් සහ උපකරණ රු.	ගෘහ භාණ්ඩ හා සවිකිරීම් රු.	එකතුව රු.
2020 අප්‍රේල් 01 දිනට	226,240,000	52,123,790	240,616,923	86,209,348	37,936,048	60,171,201	3,683,040	75,754,274	782,734,622
එකතුකිරීම්	-	-	85,435,863	-	435,647	2,572,023	219,460	2,198,683	90,861,676
ස්ථාවර වත්කම් බැහැර කිරීමේ පිරිවැය		-	-	-	36,600	163,842	-	91,598	292,041
2021 මාර්තු 31 දිනට ශේෂය	**226,240,000**	**52,123,790**	**326,052,785**	**86,209,348**	**38,335,095**	**62,579,382**	**3,902,500**	**77,861,358**	**873,304,257**
ක්ෂයවීම/හානිවීම									
2020 අප්‍රේල් 01 දිනට	-	51,013,920	125,780,128	85,563,740	15,854,332	57,366,217	1,614,848	43,376,245	380,569,428
වසර සඳහා ක්ෂය ගාස්තුව		1,109,867	21,649,891	642,356	3,833,509	3,024,859	390,250	7,786,136	38,436,869
ස්ථාවර වත්කම්	-	-	-	-	3,660	163,842	-	52,639	220,142
2021 මාර්තු 31 දිනට ශේෂය	**-**	**52,123,787**	**147,430,019**	**86,206,095**	**19,684,181**	**60,227,233**	**2,005,098**	**51,109,741**	**418,786,156**
2020 අප්‍රේල් 01 දිනට ශේෂය	226,240,000	1,109,870	114,836,795	645,608	22,081,716	2,804,984	2,068,192	32,378,029	402,165,193
2021 මාර්තු 31 දිනට ශේෂය	**226,240,000**	**1**	**178,622,765**	**3,253**	**18,650,913**	**2,352,148**	**1,897,402**	**26,751,617**	**454,518,102**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 11 - කොටස්වල ආයෝජන

	2020 / 2021 රු.	2019 / 2020 රු.
එස් ටී සී මෙඩිකල් ලිමිටඩ්	49,990	49,990
අඩු කළා : එස් ටී සී මෙඩිකල් ලිමිටඩ් කොටස්වල ආයෝජනයේ අගය කපා හැරීම	(49,990)	(49,990)
	-	-
ලංකා නැවි සමාගම	20	20
	20	**20**

සටහන 12 අ - කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය

	සටහන්	2020 / 2021 රු.	2019 / 2020 රු.
ජංගම නොවන			
කාර්ය මණ්ඩල ණය	12.1	11,433,857	12,110,696
පෙර ගෙවුම් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	12.2	824,758	906,252
		12,258,615	**13,016,948**
ජංගම			
කාර්ය මණ්ඩල ණය	12.1	5,317,287	5,241,152
පෙර ගෙවුම් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	12.2	646,983	664,178
		5,964,270	**5,905,330**
		18,222,885	**18,922,278**

සටහන 12.1 - කාර්ය මණ්ඩල ණය

වර්ෂය ආරම්භයේ දී ශේෂය	18,922,278	15,259,988
වර්ෂය තුල ප්‍රදානය කළ ණය	8,260,500	10,013,332
ආපසු අය කර ගත් ණය	(8,959,891)	(6,351,042)
	18,222,887	**18,922,278**
පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ වෙත පැවැරුම	(1,471,743)	(1,570,430)
වසර අවසානයේ දී ශේෂය	**16,751,144**	**17,351,848**
ජංගම නොවන	11,433,857	12,110,696
ජංගම	5,317,287	5,241,152
	16,751,144	**17,351,848**

සටහන 12.2 - පෙර ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

වසර ආරම්භයේ දී ශේෂය	1,570,455	1,246,270
වසර තුළ වැකතු කිරීම්	842,030	1,054,448
ක්‍රමක්ෂය	(944,747)	(730,263)
වසර අවසානයේ දී ශේෂය	**1,467,737**	**1,570,455**
ජංගම නොවන	824,758	906,252
ජංගම	646,983	664,178
	1,471,741	**1,570,430**

සමාගම සහනදායී අනුපාත යටතේ සේවකයන්ට ණය ලබා දෙයි. ඒ හා සමාන ණය සඳහා වෙළඳපොළ ආශ්‍රිත අනුපාත භාවිත කරමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම මගින් සේවක ණයවල සාධාරණ වටිනාකම නිර්ණය කරනු ලැබේ. සේවක ණයවල පිරිවැය සහ සාධාරණ වටිනාකම අතර වෙනස්කම් හඳුනා ගනු ලබනුයේ පෙර ගෙවූ කාර්යමණ්ඩල ප්‍රතිලාභ ලෙසය. මෙම ණය ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබීය.

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථා පොළිය	7%	7%
වෙළඳපොළ පොළී අනුපාත	7%	12%

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 12 ආ - පහසු ගෙවීමේ ණය යෝජනා ක්‍රමය	සටහන්	2020 / 2021 රු.	2019 / 2020 රු.
ජංගම නොවන			
දළ ආයෝජනය	12.3	9,391	879,697
අඩු කළා : නොඉපැයූ මූල්‍ය ආදායම	12.4	(163)	(70,530)
		9,228	**809,167**
ජංගම			
දළ ආයෝජනය	12.3	856,444	2,341,338
අඩු කළා : නොඉපැයූ මූල්‍ය ආදායම	12.4	(69,667)	(331,299)
		786,777	**2,010,039**
		796,005	**2,819,206**

සටහන 12.3 - දළ ආයෝජනය		
වසර ආරම්භයේ දී ශේෂය	2,819,206	6,024,888
වසර තුළ දළ ආයෝජනය	-	303,602
අඩු කළා : ලැබුණු කුලී	(2,023,200)	(3,509,284)
	796,006	**2,819,206**
එකතු කළා : නොඉපැයූ මූල්‍ය ආදායම	69,830	401,829
වසර අවසානයේ දී ශේෂය	**865,835**	**3,221,035**
ජංගම නොවන	9,391	879,697
ජංගම	856,444	2,341,338
	865,835	**3,221,035**

සටහන 12.4 - නොඉපැයූ මූල්‍ය ආදායම		
වසර ආරම්භයේ දී ශේෂය	401,829	1,156,222
වසර තුළ ලබා ගත් ණය	-	88,642
අඩු කළා: වසර සඳහා පොළී ආදායම	(331,999)	(843,035)
වර්ෂය අවසානයේ දී ශේෂය	**69,830**	**401,829**
ජංගම නොවන	163	70,530
ජංගම	69,667	331,299
	69,830	**401,829**

සටහන 13 - තොග	2020 / 2021 රු. ශත	2019 / 2020 රු. ශත
අවසන් තොගය	439,447,849	482,425,806
මාර්ගස්ථ භාණ්ඩ	36,881,896	103,419,757
හානි වූ සහ සෙමෙන් අළෙවි වන තොග සඳහා ප්‍රතිපාදනය	(43,269,916)	(37,109,194)
	433,059,829	**548,736,369**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 14 - වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

	2020 / 2021 රු.	2019 / 2020 රු.
වෙළඳ ණයගැතියෝ	544,166,336	544,864,153
ණයගැති හානි සඳහා අඩු කිරීම්	(9,192,349)	(9,357,912)
	534,973,987	**535,506,241**
වෙනත් ලැබීම්	5,100,000	24,000,000
උත්සව අත්තිකාරම	48,000	2,299,250
උත්සව ණය	4,056,000	-
විදුලිය සඳහා තැන්පතු	828,000	825,000
ආරක්ෂිත තැන්පතු - ජා.ඉ. බැංකුව	1,039,642	1,057,641
බහාලුම් තැන්පතු	339,000	450,138
කුලී මුදල් තැන්පතු	19,764,288	20,694,288
විවිධ තැන්පතු	606,500	596,500
වරාය අධිකාරිය - PVQ	50,000	50,000
ලංසු බැඳුම්කර ගිණුම	26,840	33,640
පෙර ගෙවුම්	-	1,756,207
සුළු මුදල්වලින් කාර්ය මණ්ඩල අත්තිකාරම්	70,500	68,200
ඇපකර - මහජන බැංකුව	600,000	600,000
ලැබිය යුතු පොළිය	21,346,502	26,837,883
ආදායම් බදු ස්වයං තක්සේරු කිරීම් මත ගෙවීම්	2,776,691	2,776,691
ලැබියයුතු රැඳවුම් බද්ද	46,413	46,413
අධ්‍යාපන දෙපාර්තමේන්තුව	7,784,039	7,784,039
විවිධ වියදම් අත්තිකාරම	957,502	1,005,199
සේවා සඳහා අත්තිකාරම්	543,970	182,195
අනෙකුත් ගෙවිය යුතු දෑ මත අත්තිකාරම	4,517,081	4,517,081
Q-Shop සඳහා අත්තිකාරම්	2,410	-
ටෙන්ඩර් සහ අනෙකුත් තැන්පතු	-	119,500
බදු කුලී අත්තිකාරම ගෙවීම - පළමු වසර	382,500	-
පොළිය මත රඳවා ගැනීමේ බද්ද	6,925,363	6,925,363
නැව් ගාස්තු ඇප සහතික ආන්තිකය - මහජන බැංකුව	3,652,043	1,645,660
නැව් ගාස්තු ඇප සහතික ආන්තිකය - සම්පත් බැංකුව	6,186,000	-
කාර්ය මණ්ඩල ණයගැතියෝ - වැටුප් අත්තිකාරම	2,896,680	3,832,700
ඩේවිඩ් පීරිස් මෝටර් රථ සමාගම	1,074,440	1,074,440
අබලි බැටරි පාලන ගිණුම	2,824,248	1,498,109
සයන්ටර් ටෙක්නොලොජීස් (පුද්) සමාගම	1,805,000	1,805,000
ණය / කුලීපිට ගැනුම්, කුලී, රක්ෂණ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	4,248,110	4,492,562
රජවාස නාමපුවරු සඳහා ප්‍රතිපූර්ණය	432,465	-
	635,904,213	**652,479,938**

සටහන 15 - අතැති මුදල් සහ මුදලට සමාන දෑ

	2020 / 2021 රු.	2019 / 2020 රු.
බැංකුවේ ඇති මුදල්		
ලංකා බැංකුව (ගි.අ. 8859546)	270,158	270,158
සම්පත් බැංකුව (ගි.අ. 000930000337)	1,527,530	114,961
ලංකා බැංකුව (ගි.අ. 1060)	20,097	20,097
ජා. ස. බැංකුව (ගි.අ. 101000160408)	-	15,357,749
මහජන බැංකුව - කුරුණෑගල	1,645,122	243,060
මහජන බැංකුව - මහනුවර	889,238	792,596
මහජන බැංකුව - මාතර	1,453,042	-
මහජන බැංකුව - කල්මුණේ	1,068,091	526,004
මහජන බැංකුව - පොලොන්නරුව	974,132	3,829,302
සුළු මුදල් අග්‍රිමය	657,273	607,248
අතැති මුදල්	34,230,299	1,087,680
	42,734,983	**22,848,856**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 16 - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

	2020 / 2021 රු.	2019 / 2020 රු.
වසර ආරම්භයේ දී ශේෂය	35,156,945	30,215,207
වසර තුළ වෙන් කළ ප්‍රතිපාදනය	19,307,077	9,736,844
වසර තුළ සිදු කළ ගෙවීම්	(8,167,116)	(4,795,106)
වසර අවසානයේ දී ශේෂය	**46,296,906**	**35,156,945**

ප්‍රතිලාභ ගණනය කිරීම පිණිස කළමනාකාරිත්වය විසින් යොදා ගනු ලැබ ඇති තක්සේරු ක්‍රමය වනුයේ ශ්‍රී ලංකා ඛිණුම්කරණ ප්‍රමිත අංක 19 'කාර්ය මණ්ඩල ප්‍රතිලාභ' මගින් නිර්දේශ කරනු ලැබ ඇති 'ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමයයි'.

වසර මුළුල්ලෙහි විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ සංචලනය පහත පරිදි වේ.

	2020 / 2021 රු.	2019 / 2020 රු.
පොළී වියදම	2,450,074	3,625,825
වත්මන් සේවා වියදම	3,398,890	2,180,702
කාර්ය මණ්ඩල පිරිවැයේ ඇතුලත් කර ඇති මුළු ප්‍රමාණය	**5,848,964**	**5,806,527**
හඳුනා ගත් සත්‍ය ශුද්ධ ලාභ/අලාභ	13,458,113	3,930,317
හඳුනා ගත් මුළු විස්තීරණ ආදායම	**19,307,077**	**9,736,844**

කළමනාකාරිත්වය විසින් භාවිත කරනු ලැබූ ප්‍රධාන උපකල්පනයන්ට පහත දෑ අන්තර්ගත වේ.

මූල්‍ය උපකල්පන	31.03.2021	31.03.2020
වාර්ෂික පොළී අනුපාතය	7%	12%
වැටුප් වැඩි වීමේ අනුපාතය	1%	1%
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය	5%	4%
විශ්‍රාම යාමේ වයස (අවුරුදු)	60	60

සමාගම ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවතිනු ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 17 - ශුද්ධ විලම්භිත බදු වගකීම (වත්කම)

	2020 / 2021 රු.	2019 / 2020 රු.
වසර ආරම්භයේ දී ශේෂය	(11,859,477)	(11,427,278)
වසර සඳහා ප්‍රතිපාදනය/ප්‍රතිවර්තනය	(3,852,183)	(432,198)
වසර අවසානයේ ශේෂය	**(15,711,660)**	**(11,859,477)**

විලම්භිත බදු ගණනය කරනු ලබන්නේ ස්ථාවර වත්කම්වල ධාරණ වටිනාකම සහ බදු අය කළ හැකි එක් එක් ක්‍රියාකාරකම මගින් විශ්ලේෂණය කළ පරිදි එවැනි වත්කම්වල බදු ලියා හළ අගය අතර තාවකාලික වෙනස්කම් ලෙසය.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම්වල ධාරණ වටිනාකම් ආශ්‍රිත කාල වෙනස්කම්වලින් පැන නගින බදු බලපෑමේ සැසඳුම පහත පරිදිය.

	2020 / 2021 රු.	2019 / 2020 රු.
සෙමින් අළෙවි වන තොග සඳහා ප්‍රතිපාදනය	(1,478,573)	(5,476,554)
බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය	39,735	247,574
සේවක ප්‍රතිලාභ වගකීම	(2,673,591)	22,591
බදු කාර්යයන් සඳහා ත්වරිත ක්ෂය	260,246	4,774,190
	(3,852,183)	**(432,199)**

සටහන 18 - කෙටිකාලීන ණය ගැනුම්

	2020 / 2021 රු.	2019 / 2020 රු.
ජංගම නොවන වගකීම්		
කාලීන ණය - මහජන බැංකුව	1,310,000	16,934,000
කාලීන ණය - සම්පත් බැංකුව - කල්බදු	-	-
	1,310,000	**16,934,000**
ජංගම වගකීම්		
දිගුකාලීන		
කාලීන ණය - මහජන බැංකුව	15,624,000	15,624,000
කාලීන ණය - සම්පත් බැංකුව - කල්බදු	-	3,125,430
	15,624,000	**18,749,430**
කෙටිකාලීන		
කාලීන ණය - මහජන බැංකුව	69,630,020	423,948,522
උත්සව ණය - මහජන බැංකුව	4,101,236	-
කාලීන ණය - සම්පත් බැංකුව	134,878,886	214,590,601
කාලීන ණය - ජා.ස. බැංකුව	346,915,480	51,488,333
	555,525,623	**690,027,456**
	571,149,623	**708,776,886**
මුළු ණය වගකීම	**572,459,623**	**725,710,886**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 19 - වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

	2020 / 2021 රු.	2019 / 2020 රු.
වෙළඳ ණයහිමියෝ	478,771,502	400,888,236
විදේශ ආනයන වගකීම	177,969,241	203,641,921
උපචිත වියදම්	58,418,580	37,945,861
ගෙවිය යුතු ලාභාංශ	11,000,000	11,000,000
ගෙවිය යුතු එකතු කළ අගය මත බදු	10,454,982	14,133,886
අනෙකුත් ණයහිමියෝ - විවිධ	7,667,267	12,420,074
විගණන ගාස්තු	3,600,000	2,304,000
ආරක්ෂිත තැන්පතුව - ජා. ඉ. බැංකුව	1,040,054	1,057,641
සේ. අ. අ.	3,262,865	3,385,561
සේ. භා. අ.	391,532	406,268
කාර්ය මණ්ඩල ණයහිමියෝ - නැවත බැංකු ගත කළ වැටුප් ආදිය	372,215	500,009
වැටුප් අඩු කිරීම්	313,912	392,143
වැටුප් අඩු කිරීම් - කාර්ය මණ්ඩලය සහ අනෙකුත්	74,475	49,056
කාර්ය මණ්ඩල සඳහා සහන ඇති කිරීමේ අරමුදල	225,021	225,021
ඒබීසී ට්‍රේඩ් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්	1,041,629	1,041,629
සාලා එන්ටප්‍රයිසස්	94,507	95,507
අබාන්ස් (පුද්) සමාගම	1,920,661	1,920,661
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	132,000	60,000
ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද	-	57,363
එට්සලාට් ණය කාඩ්පත්	748,683	748,683
නොමිලේ නිකුත් කරන භාණ්ඩ පාලන ගිණුම	109,583	109,584
මුද්දර ගාස්තු වියදම් අය කර ගැනීම	25,900	25,950
ණය/කුලීපිට ගැනුම් අත්තිකාරම	1,196,534	1,193,953
කල්බදු උපකරණ සඳහා ණයහිමියෝ	165,012	165,012
ලැබිය යුතු මුදල් - යාපනය ප්‍රදර්ශනාගාරය	415,128	415,128
ණය/කුලී පිට ගැනුම් සඳහා ගෙවිය යුතු රක්ෂණය	49,232	49,232
ස්ටැෆඩ් මෝටර් (පුද්) සමාගම	28,000	28,000
රඳවා ගැනීම	3,098,937	2,896,059
සේවා කොන්ත්‍රාත් මත රඳවා ගැනීම	1,363,112	956,659
ආදායම අහිමි වීම පියවීමේ ගිණුම - යාපනය ප්‍රදර්ශනාගාරය	238,765	238,765
ආපසු නොගෙවියයුතු ආරක්ෂක තැන්පතු - රජවාස	17,083,258	-
	781,272,588	**698,351,859**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 20 - බැංකු අයිරා

	2020 / 2021 රු.	2019 / 2020 රු.
මහජන බැංකුව (ගිණුම් අංකය 004100120210918)	235,770,839	315,160,721
මහජන බැංකුව - මාතර	-	351,532
සම්පත් බැංකුව - DFS (ගිණුම් අංකය 002930006974)	17,471,340	16,242,595
ජා. ස. බැංකුව (ගිණුම් අංකය 101000160408)	20,382,602	-
	273,624,781	**331,754,848**

සටහන 21 - රජයේ ප්‍රදානය විලම්භිත ආදායම් ගිණුම

	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-1 රු.	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-2 (රජවාස) රු.	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-2 (Q Shop බහාලුම් වියදම්) රු.	රජයේ ප්‍රදානය විලම්බිත ආදායම් ගිණුම-2 (Q Shop ඉදිකිරීම් වියදම්) රු.	එකතුව රු.
වසර ආරම්භයේදී ශේෂය	50,944,377	-	-	-	50,944,377
වසර තුළ රජයේ ප්‍රදාන	-	93,328,028	7,200,000	2,284,200	102,812,228
එකතුව	**50,944,377**	**93,328,028**	**7,200,000**	**2,284,200**	**153,756,604**
ලාභ/අලාභ ගිණුමට අය කළා (2020/2021)	6,368,047	7,179,079	360,000	456,840	14,363,966
වසර අවසානයේදී ශේෂය	**44,576,330**	**86,148,949**	**6,840,000**	**1,827,360**	**139,392,638**

සටහන 22 - සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු

අ) ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 -'සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම' ප්‍රකාරව, ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු අස්තිත්වයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මග පෙන්වීම සහ පාලනය කිරීම සඳහා අධිකාරිය සහ වගකීම ඇති අය වේ. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළුව), අධ්‍යක්ෂ මණ්ඩලයට ආසන්නම පහළ මට්ටමේ සිටින සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සංස්ථාවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගීකරණය කර තිබේ.

(i) අධ්‍යක්ෂවරුන් සඳහා ණය

සමාගමේ අධ්‍යක්ෂවරුන්ට කිසිදු ණයක් ප්‍රදානය කොට නොමැත.

(ii) ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග වෙනත් ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන 21(**අ**)හි හෙළිදරව් කර ඇති ගනුදෙනු හැර ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

සටහන 23 - ප්‍රාග්ධන වගකීම්

2021 මාර්තු 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ගිවිසුම්කර ප්‍රාග්ධන වියදම් සහ අවිනිශ්චිතතාවයන් නොතිබුණි.

සටහන 24 - සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනය පහසු කිරීම පිණිස, පෙර වර්ෂය හා සම්බන්ධ අදාළ ශේෂ ප්‍රවර්තන වසරේ වර්ගීකරණයට අනුකූල වන සේ නැවත වර්ගීකරණය කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2020/2021

සටහන 25 - මූල්‍ය අවදානම් කළමනාකරණය

දළ විශ්ලේෂණය

මූල්‍ය උපකරණ භාවිතයෙන් පහත දැක්වෙන අවදානම්වලට සංස්ථාව නිරාවරණය වේ.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම
- වෙළඳපොළ අවදානම (ව්‍යවහාර මුදල් අවදානම සහ පොළී අනුපතා අවදානම ඇතුළුව)

ඉහත එක් එක් අවදානම වෙත සංස්ථාවේ නිරාවරණය පිළිබඳ ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සහ අවදානම මැනීම සහ කළමනාකරණය කිරීම සඳහා සංස්ථාවේ අරමුණු, ප්‍රතිපත්ති සහ පටිපාටි මෙම සටහන ඉදිරිපත් කරයි.

අවදානම් කළමනාකරණ රාමුව

සංස්ථාවේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. සංස්ථාවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපනය කරනු ලබනුයේ සංස්ථාව විසින් මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීමටත්, උචිත අවදානම් සීමා සහ පාලන පැන වීමටත් අවදානම් සහ සීමාවන්ට අනුගත වීම අධීක්ෂණය කිරීමටත්ය. වෙළඳපොළ තත්ත්වයන් සහ සමාගමේ ක්‍රියාකාරකම් පිළිඹිබු කිරීම පිණිස අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

ණය අවදානම

ණය අවදානම යනු පාරිභෝගිකයකු හෝ මූල්‍ය උපකරණයක ප්‍රතිපාර්ශවය සිය ගිවිසුම්කර බැඳීම් සපුරාලීමට අපොහොසත් වුවහොත් සිදුවන මූල්‍ය අලාභය වන අතර එය මූලික වශයෙන් පැන නගිනුයේ පාරිභෝගිකයින්ගෙන් සහ ආයෝජන සුරැකුම්පත්වලින් සංස්ථාවට ලැබිය යුතු දෑවලිනි.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීම මගින් පියවනු ලබන තම මූල්‍ය වගකීම් ආශ්‍රිත බැඳීම් සපුරාලීමේ දී සංස්ථාව මුහුණ දෙන අවදානම වේ. මෙම අවදානම කළමනාකරණය කිරීමේ දී සංස්ථාවේ ප්‍රවේශය වනුයේ, පිළිගත නොහැකි අලාභ හෝ සංස්ථාවේ කීර්තිනාමයට සිදුවන හානිවලින් තොරව, ගෙවිය යුතු අවස්ථාව වන විට තම වගකිම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් තමන් සතුව සැම විටම පවතින බව හැකිතාක් දුරට සහතික කිරීමයි.

ද්‍රවශීලතා අවදානම මැනීම සහ අවම කිරීම පිණිස සංස්ථාව තම ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමීපව අධීක්ෂණය කර, මුදල් හා මුදල් සමාන දෑ ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගත් අතර මූල්‍ය ආයතනවලින් එකඟ වූ අරමුදල් පහසුකම් ලබා ගන්නා ලදී.

වෙළඳපොළ අවදානම

වෙළඳපොළ අවදානම යනු විදේශ විනිමය අනුපාත, පොළී අනුපාත ආදිය වැනි වෙළඳපොළ මිල වෙනස්වීම්, සංස්ථාවේ ආදායම හෝ මූල්‍ය උපකරණවල එහි කොටස් වටිනාකම කෙරෙහි බලපෑමේ අවදානමයි. වෙළඳපොළ අවදානම කළමනාකරණය කිරීමේ අරමුණ වනුයේ ලාභ ප්‍රශස්ත කරමින් පිළිගත් පරාමිතීන් තුළ වෙළඳපොළ අවදානම් පාලනය හා කළමනාකරණය කිරීමයි.

පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාතවල වෙනස්කම් හේතුවෙන් මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහ විචලනය වීමේ අවදානමයි. වෙළඳපොළ පොළී අනුපාත ප්‍රධාන කොටම සම්බන්ධ වනුයේ සංස්ථාවේ දිගුකාලීන ණය බැඳීමට සහ පාවෙන පොළී අනුපාත සහිත ආයෝජනයන්ටය. කෙසේවෙතත්, වාර්තාකරණ දිනයට සැලකිය යුතු පොළී අනුපාත අවදානමක් ඇතිකරන්නා වූ ප්‍රමාණාත්මක දිගුකාලීන පාවෙන අනුපාත ණය ගැනුම් හෝ තැන්පතු සමාගම සතුව නොමැත.